# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2391/34 – 2024 ජූලි මස 05 වැනි සිකුරාදා – 2024.07.05**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/05/2017/55.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2019.06.14 දිනැති හා අංක 2127/34 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.06.06 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් තලංගම උතුර, 3 වන පටුමඟ, මුවන්හෙලවත්ත, අංක 743/2ඒ හි පදිංචි පී.එච්.පී.ආර්.හේරත් මයා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් පන්නිපිටිය, මාකුඹුර, හයිලෙවෙල් පාර, අංක 321/1 හි පිහිටි ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 66/2019 හා 2024.04.29 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 ජුනි මස 20 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.

යොමු අංකය: IR/COM/05/2017/55.
නඩු අංකය: A/66/2019.

පී. එච්. පී ආර්. හේරත් මයා,
නො. 743/2A, මුවන්හෙල වත්ත
3 වන පටුමඟ,
තලංගම උතුර.

*පළමු පාර්ශ්වය*

එදිරිව

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය,
නො. 321/1,
හයිලෙවෙල් පාර,
මාකුඹුර,
පන්නිපිටිය.

*දෙවන පාර්ශ්වය*

කම්කරු හා වෘත්තීය සම්බන්ධතා අමාත්‍ය රවින්ද්‍ර සමරවීර මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා 2019.06.06 දිනැති නියෝගයෙන් බේරුම්කරුවකු වශයෙන් මා පත්කොට මා වෙත යොමුකර ඇත.

**ආරාවුලට තුඩු දුන් කාරණය:-**

බේරුම්කරණය සඳහා මා වෙත යොමු කර ඇති උක්ත නියෝගය ප්‍රකාරව ඉහත සඳහන් දෙපාර්ශ්වය අතර උද්ගතවී ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය ලෙස කම්කරු කොමසාරිස් ඒ. විමලවීර මහතා විසින් 2019 මැයි මස 24 වන දිනැතිව එවා ඇති ලිපියේ දැක්වෙන්නේ,

"ජාතික අධ්‍යාපන භාෂා පුහුණු ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ සේවය කරන පී. එච්. පී. ආර් හේරත් මහතා හට ඔහුගේ සේවා ගිවිසුමේ කොන්දේසියක් වන ගෘහ භාණ්ඩ සහිත නිල නිවාස හිමිකම 2015.05.19 දින වැඩ තහනමට ලක්කර නැවත සේවයේ පිහිටුවීමෙන් පසුව ලබා නොදීම තුලින් අසාධාරණයක් සිදුවී තිබේද? එසේ සිදු වී තිබේ නම් ඔහුට ලැබිය යුතු සහන කවරේද" යන්න පිළිබඳව වේ.

**පසුබිම සහ නඩු කාර්ය පරිපාටිය :-**

මෙම නඩුව විභාගයට ගැනීමට පෙර මූලිකව දෙපාර්ශ්වයේම ප්‍රකාශන කැඳවා ඇත.
ඒ අනුව ඉල්ලුම්කාර පාර්ශ්වය විසින් තම පළමු ප්‍රකාශය ඇමුණුම් හතරකින්ද යුතුව 2019.07.26 දින ඉදිරිපත්කර ඇති අතර, එහි ප්‍රකාශකර ඇත්තේ තමන් 2008.08.01 දින සිට වග උත්තරකාර ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස පත්වීම් ලබා එකී තනතුරෙහි කටයුතු කළ බවත්, එකී පත්වීමට අනුරූපව තමන්ට 2008 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වැටුපට අමතරව නිල නිවාස පහසුකම් ලද බවත්, 2015 වර්ෂයේ තමන් වැඩ තහනමට ලක් වූ අතර එම වසරේම නඩු තීරණයකින් පසු තමන් නැවත සේවයේ පිහිටු වූ බවත්, ප්‍රකාශ කර ඇත. කෙසේ වුවද එකී වැඩ තහනමින් පසු නැවත සේවයේ පිහිටු වුවද, එසේ නැවත සේවයේ පිහිටු වීමෙන් පසු තමන්ට නිල නිවාස පහසුකම් ලබාදීම හෝ නිල නිවාස පහසුකම් ලබා ගැනීම සඳහා ප්‍රතිපාදන ලබාදීම හෝ සිදුකර නොමැති බව ප්‍රකාශ කර සිටී. තමන්ට අවසාන වශයෙන් ගෙවූ ගෙවල් කුලී දීමනාව රු: 25000/=ක් බවත් ඒ අනුව 2015 මැයි මස 31 දින සිට තමන්ට අහිමි කර ඇති ගෙවල් කුලී දීමනාව ලබා දෙන ලෙස වැඩි දුරටත් ඉල්ලා සිටී.

මේ හැර වග උත්තරකාර පාර්ශ්වය මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් සිය ලිඛිත ප්‍රකාශයක් යොමු කර නොමැති අතර ඒ වෙනුවට එකී පාර්ශ්වය 2020.01.09 දිනැති ලිපිය ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර ඇත්තේ සිය ආයතනයට සභාපතිවරයෙකු සහ කළමනාකරණ මණ්ඩලයක් පත්කර නොමැති බැවින් සිය ලිඛිත ප්‍රකාශන ඉදිරිපත් කිරීමට දීර්ඝ දිනයක් ලබාදෙන ලෙසයි.

කෙසේ වුවද, මෙම නඩුව 2020.01.14 දින විභාගයට ගත් අතර මෙතෙක් කළමනාකාර මණ්ඩලයක් හෝ සභාපතිවරයකු පත්කර නොමැති බැවින් මේ පිළිබඳව උපදෙස් ලබා ගැනීමට නොහැකි වූ බවත් ඒ අනුව සාකච්ඡාව සඳහා වෙනත් දිනයක් ඉල්ලා සිටින ලදී. මේ පිළිබඳව සමථයක් තිබේද යන්න සම්බන්ධයෙන් සාකච්ඡා කළ අතර මේ පිළිබඳව සලකා බලා වාර්තා කිරීමට දින අයැද සිටින ලදී.

නැවත මෙම නඩුව 2020.02.19 දිනට නියම කර ඇති අතර එදින වග උත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටීමක් හෝ නියෝජනයක් නොවීය. ඉල්ලුම්කරු පැමිණ සිටි අතර වග උත්තරකාර පාර්ශ්වයේ නොපැමිණීම සම්බන්ධයෙන් ගාස්තු නියම කරන මෙන් ඉල්ලා ඇති අතර ඒ අනුව නොපැමිණීම සම්බන්ධයෙන් වග උත්තරකාර පාර්ශ්වයට ගාස්තු නියම කිරීමක්ද සිදු කර ඇත.

2020.02.17 දිනැතිව කාර්මික අධිකරණය වෙත ලිපියක් යොමු කරමින් වග උත්තරකාර පාර්ශ්වය විසින් පැමිණිලිකරුගේ පැමිණිල්ලට අදාලව කරුණු ඉදිරිපත්කර ඇති අතර වැඩි දුරටත් ප්‍රකාශ කර ඇත්තේ ශ්‍රේෂ්ඨාධිකරණයේ මෙම පැමිණිලිකරුගේ සේවය අවසන් කිරීම සම්බන්ධයෙන් නඩුවක් පවරා ඇති අතර එකී නඩුවේ තීරණයක් ලැබෙන තෙක් හෝ අභ්‍යන්තර විධිමත් විනය පරීක්ෂණයක් මඟින් තීරණයක් ගන්නා තෙක් නඩුව අත් හිටුවීම හෝ ඉදිරි දිනයක් ලබාදෙන ලෙසයි. ඒ අනුව 2020.08.20 දිනට මෙම නඩුව නැවත කැඳවූ අතර වග උත්තරකාර පාර්ශ්වය පැමිණ නැත. නොපැමිණීමට හේතු දක්වා ද නැත. මේ අනුව 2021.03.10 දිනට නැවත විභාගය සඳහා දින නියම කර ඇති අතර දෙපාර්ශ්වයම අනිවාර්යයෙන් සහභාගි විය යුතු බවට ලියාපදිංචි තැපෑලෙන් දැන්වීමට නියම කර ඇත.

මේ අනුව 2021.03.10 දින නැවත මෙම නඩුව කැඳවූ අවස්ථාවේ සභාපතිවරයා නඩුව විභාගය සඳහා පැමිණ ඇති අතර ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කර පැමිණිලිකරුට සහනයක් ලබා දීමට කටයුතු කරන බවට ප්‍රකාශ කර ඇත. ඒ අනුව දෙපාර්ශ්වය අතර සමථයක් ඇතිකර ගැනීමට කටයුතු කරන බවටද ප්‍රකාශ කර ඇත.

එලෙස සමථයක් නොවූයෙන් 2022.02.07 දින මෙම නඩුව නැවත විභාගයට නියම කර ඇත. එහිදී වග උත්තරකාර පාර්ශ්වය ප්‍රකාශ කර ඇත්තේ ඉල්ලුම්කරුට අගතියක් සිදුව ඇත්තේ වගඋත්තරකාර ආයතනයේ කළමණාකාරිත්වයේ තීරණය මත නොව රාජ්‍ය කළමනාකාර පාර්ශ්වය විසින් ගන්නා ලද තීරණයක් මත බවයි. ඒ අනුව ආයතන සංග්‍රහය සහ මුදල් රෙගුලාසිවලට අනුව අමාත්‍යාංශ ලේකම්වරයාගේ උපදෙස් පරිදි ක්‍රියා කරන බවද ප්‍රකාශ කර ඇත.

මේ අනුව 2022.03.24 දින මෙම නඩුව කැඳවා ඇති අතර දෙපාර්ශ්වයම පැමිණ නැත. 2022.04.07 දින ඉල්ලුම්කරුද උනන්දුවක් නොදක්වන්නේ නම් මෙම පැමිණිල්ල නිෂ්ප්‍රභා කිරීමට කටයුතු කරන බවට ඉල්ලුම්කරුට දන්වා ඇත. මෙම පැමිණිල්ලට අභියාචනයක් කරමින් ඉල්ලුම්කරු ප්‍රකාශ කර ඇත්තේ තමන් විදේශ ගතව සිටි බැවින් 2023.03.24 දින පැමිණීමට නොහැකි වූ බවත් නඩු විභාගය සඳහා ඉදිරි දිනයක් ලබා දෙන ලෙසත්ය. ඒ අනුව 2022.08.18 දින මෙම නඩුව කැඳවූ අතර ඉල්ලුම්කරු පැමිණියද වග උත්තරකරු පෙනී නොසිටි හෙයින් මෙම නඩුව පැමිණිලිකරුගේ සාක්ෂි මත ඒක පාර්ශ්විකව විභාගයට ගන්නා බව දන්වා ඇත. මේ අනුව 2022. 09.29 දිනට මෙම නඩුව නැවත විභාගයට නියම කළද ඉල්ලුම්කරු පමණක් පැමිණ ඇති අතර වග උත්තරකරු පැමිණ නැත.

ඉහත කී පරිදි නඩු විභාගය මෙහෙය වූ අවස්ථා වන 2020.02.10, 2020.08.20, 2022.03.24, 2022.08.18 දිනයන්හි වගඋත්තරකාර පාර්ශ්වය පැමිණ නොමැත. මේ අනුව අවසාන වශයෙන් 2022.09.29 දිනට මෙම නඩුව විභාගයට නියමකර ඇති අතර වග උත්තරකාර පාර්ශ්වය නොපැමිණෙන්නේ නම් පැමිණිලිකරුගේ සාක්ෂි මත ඒක පාර්ශ්විකව නඩුව විභාගයට ගන්නා බව දෙපාර්ශ්වයටම දන්වා ඇත.

සාක්ෂි සම්පිණ්ඩනය සහ විශ්ලේෂණය :

2022.09.29 දින ද වගඋත්තරකාර පාර්ශ්වය නොපැමිණි අතර පැමිණිලිකාර පාර්ශ්වය සිය සාක්ෂි දිවුරුම් ප්‍රකාශයක් මගින් ඉදිරිපත් කිරීමට අවසර ඉල්ලා ඇත. ඒ අනුව එයට ඉඩ දී ඇති අතර පැමිණිල්ලේ දිවුරුම් ප්‍රකාශය 2022.10.04 දිනැතිව ඇමුණුම් 01 සිට 07 දක්වා ඉදිරිපත් කර ඇත. එකී දිවුරුම් ප්‍රකාශයට අනුව ඉල්ලුම්කරුට 2008.08.01 දින සිට ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් රැකියාව ලැබ කටයුතු කර ඇති බවත් තමන් ඊට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරියෙකු ලෙස ස්ථිර සේවයේ නියුතුව සිටි බවත්, ප්‍රකාශ කර ඇත. වගඋත්තරකාර ආයතනයේ ඉහත කී තනතුර සඳහා තමන් අයදුම්කර ඇත්තේ ඇමුණුම 01හි දැක්වෙන පුවත්පත් දැන්වීම පරිදි එකී තනතුර සඳහා නිල නිවාස පහසුකම් ලබා දෙන බව දැන්වීම නිසා බවත් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

ඒ අනුව තමන් එකී වරප්‍රසාද ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන් තමන් මුලින් කළ රැකියාවෙන් ඉවත්ව වග උත්තරකාර ආයතනයේ සේවයට බැඳුන බවත් ප්‍රකාශ කර ඇත. පත්වීමේ මුල් අවස්ථාවේ නිල නිවසක් සහිත පහසුකම් ලැබුන බවත් රැකියා ස්ථානය වෙනස්

වීමෙන් පසුව තමන්ට නිල නිවාස වෙනුවට කුලී පදනම් මත නිවසක් ගැනීමට රු.24000 ක ගෙවීමක් කර ඇති බවත් ප්‍රකාශ කර ඇත. කළමනාකාර මණ්ඩලයීය තීරණයක් මත මෙම ගෙවීම කළ අතර එය 2015 මැයි 31 දක්වා ගෙවූ බවද ප්‍රකාශ කර ඇත.

තවද තමන්ගේ වැඩ තහනම් කිරීමක් 2015 මාර්තු මාසයේදී සිදු වූ අතර එයින් පසු මාසික ගෙවල් කුලී දීමනාව නතර කළ බවත් තමන්ට ලබාදී තිබූ ගෘහ භාණ්ඩ ආපසු ලබා ගත් බවද දිවුරුම් ප්‍රකාශයේ සඳහන් කර ඇත.

තවද තමන්ගේ සේවය නතර කිරීම නිමිත්තෙන් අධිකරණය මගින් නැවත සේවයේ පිහිටුවීමට නියෝගයක් ලැබුණද ඒ අනුව නැවත සේවයේ පිහිටු වුවද තමන්ට නිල නිවසක් ලබා දීම සම්බන්ධයෙන් පත්වීම් ලිපියේ තිබූ කොන්දේසි කඩකර ඇති බවත් ඒ අනුව මේ දක්වා ම තමන්ට නිල නිවසක් ලබා දී නොමැති බවත් ප්‍රකාශ කර ඇත.

කෙසේ වුවද විනය බලධාරියා විසින් අවස්ථා දෙකකදී ගෙවල් කුලී දීමනාව ගෙවීමට නියම කළද ඇමුණුම 04 හා 06 අනුව භාණ්ඩාගාර අනුමැතිය ඉල්ලමින් එකී ගෙවල් කුලී දීමනාව ගෙවීම පැහැර හැර ඇති බවද ප්‍රකාශ කර ඇත. කෙසේ වුවද 2015 ජූනි මස 01 සිට පෞද්ගලිකව තමන් ගෙවල් කුලී ගෙවූ බවද ප්‍රකාශ කර ඇත.

තවද කාලයත් සමග මෙම ගෙවල් කුලී දීමනාව රුපියල් 25000/=, 50000/=, 60000/= දක්වා වෙනස්ව ඇති බව ප්‍රකාශ කර ඇත. ඒ අනුව 2015 ජූනි මස 01 සිට 2022 ඔක්තෝබර් දක්වා මාස 89 සඳහා නොගෙවූ ගෙවල් කුලී වශයෙන් රුපියල් 2670000/= ක මුදලක් ලබාදෙන මෙන් ඉල්ලුම් කර ඇත. ඉහත සඳහන් දිවුරුම් ප්‍රකාශයේ කරුණු නැවත විමර්ශනය කර තහවුරු කර ගැනීම සඳහා 2022.10.06 දින ඉල්ලුම්කාර පාර්ශ්වය නැවත කැඳවා කරුණු විමසීම් කරන ලදී.

එහිදී ද ඉල්ලුම්කරු ප්‍රකාශ කර ඇත්තේ තමන් මීට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ වයඹ පළාතේ ඉංග්‍රීසි සහ ඉංග්‍රීසි මාධ්‍ය අධ්‍යක්ෂ වශයෙන් කටයුතු කළ බවත් එයින් ඉවත්ව මෙම තනතුරට පැමිණියේ මෙම තනතුරේ නිල නිවාස සහ වාහන පහසුකම් යන වැඩි ප්‍රතිලාභ ලබා දෙන නිසා බවත්ය. ඒ බව සිය පත්වීම් ලිපියේ අංක 09 යටතේ ද සඳහන් වන බවයි. 2015 දක්වා එකී ප්‍රතිලාභ තමන්ට ලැබුණු බවත්, දේශපාලන පළි ගැනීමක් මත සේවය අහිමි වූ අතර දිවුරුම් ප්‍රකාශය සමග අමුණා ඇති අංක 08 ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු තීරණය මගින් තමන් නැවත සේවයේ පිහිටුවූ බවත්, ඉන්පසුව නේවාසික පහසුකම් යන ප්‍රතිලාභය නොදී රු.24000/= ක ගෙවල් කුලී දීමනාවක් ලබාදීමට කටයුතු කර ඇති බවත් ප්‍රකාශ කර ඇත. මෙම දීමනාව ද සභාපතිවරයා විසින් 2015.05.31 දිනට පසුව නතර කර ඇති අතර ඒ පිළිබඳව විෂය භාර ඇමතිවරයාට අභියාචනා කළ බවත්, විෂය භාර ඇමතිවරයා මෙම ගෙවීම කිරීමට අනුමැතිය ලබාදී ඇති බවත් භාණ්ඩාගාරයෙන්ද මෙම ගෙවීම කිරීමට අනුමැතිය ලබාදී ඇති බවත් එසේ වුවද මෙම දීමනාව මෙතෙක් ගෙවා නොමැති බවටත් ඉල්ලුම්කරුගෙන් සාක්ෂි ලබා ගැනීමේදී ප්‍රකාශ කර ඇත. එමෙන්ම 2022.10.06 සිට ඉදිරියට තමන්ට වසර 06 ක් සේවය කිරීමට ඇති බවත් එම කාලය සඳහා මෙම ගෙවල් කුලී දීමනාව ලබා දෙන මෙන්ද ඉල්ලුම් කර ඇත.

මෙම නඩුවේ දෙපාර්ශ්වය විසින් ඉදිරිපත්කර ඇති ලිඛිත කරුණු සහ පළමු පාර්ශ්වයේ දිවුරුම් ප්‍රකාශය මගින් ඉදිරිපත් කර ඇති කරුණු සලකා බැලීමේදී පහත ක්‍රමයන් තහවුරු වේ.

01. පළමු පාර්ශ්වය දෙවැනි පාර්ශ්වය විසින් පත්වීම් ලිපියක් ලබාගැනීමේ දී අනෙකුත් ප්‍රතිලාභ සමග පදිංචිය සඳහා නිවසක් ලබා දීමට එකඟව ඇති බව දෙපාර්ශ්වයම පිළිගෙන ඇත. පළමු පාර්ශ්වය විසින් දිවුරුම් ප්‍රකාශයක් මගින් කරුණු ඉදිරිපත් කිරීමේදී ඒ සමග අමුණා ඇති අමුණුම 1, 2 ලේඛන තුලින්ද එවැනි එකගතාවයක් දෙපාර්ශ්වය අතර ඇති වූ බව තහවුරු වේ. කෙසේ වුවද දෙවැනි පාර්ශ්වය විසින් බේරුම්කරණය වෙත ඉදිරිපත් කර ඇති 2020.02.17 දිනැති ප්‍රකාශය අනුව පුවත්පත් දැන්වීමට පෙර මෙම තනතුර සඳහා බඳවා ගැනීමේ පටිපාටිය සහ ලබාදෙන පහසුකම් සම්බන්ධයෙන් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබූ බව සඳහන් කර ඇත. එලෙස අනුමැතිය ලබා නොගත්තද පසුකාලීනව මේ පිළිබඳව අනුමැතිය ඉල්ලීමේදී කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් 2009 වර්ෂයේ ප්‍රතිපාදන තුලින් මෙම වියදම් පියවා ගැනීමට විරුද්ධතාවයක් නොමැති බව දන්වා ඇති බවද සඳහන් කර ඇත. ඒ අනුව 2015 මැයි 31 දක්වා ගෙවල් කුලී පහසුකම් පළමු පාර්ශ්වයට ලබාදුන් බවද දෙවන පාර්ශ්වය පිළිගෙන ඇත. තවද එලෙස ගෙවල් කුලී සහනය ලබාදීම කළමනාකරණ දෙපාර්තමේන්තුවේද උපදෙස් ඇතිව සිදු කර බව කරුණු අනුව පෙනී යයි.

ඒ අනුව සාධාරණ හේතුවක් නොමැතිව එකී පහසුකම් අත්හිටුවීම සාධාරණ නොවන බව තීරණය කරමි.

02. කෙසේ වුවද, දෙවන පාර්ශ්වයේ 2020.02.17 ප්‍රකාශය තුලින් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත්තේ 2015 මාර්තු 19 දින පළමු පාර්ශ්වයද වැඩ තහනමට ලක්වූ බවත් ඉන්පසු එකී වැඩ තහනම් වූ කාලය තුල ඉහත කී ගිවිසුම් කාලය අවසන් වූ බවයි. එසේ වැඩ තහනම් කාලය තුල පත්වීම් ලිපියේ දක්වා ඇති ගෙවල් කුලී පහසුකම පිළිබඳව ගිවිසුම අවසන් වූයේ කෙසේද යන්නට දෙවන පාර්ශ්වය කරුණු දක්වා නොමැත. ඒ අනුව කවර පදනමක් මත ගෙවල් කුලී ගිවිසුම් අවසන් කළේද යන්න පිළිබඳව දෙවන පාර්ශ්වය විසින් නිශ්චිත කරුණු දැක්වීමක් නොමැති හෙයින් එකී ගිවිසුම අවසන් වූ බව පිළිගත නොහැක.

03. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පළමු පාර්ශ්වයේ වැඩ තහනම් කිරීම ඉවත් කර එම පළමු පාර්ශ්වය නැවත සේවයේ පිහිටු වූ බව දෙවන පාර්ශ්වය සිය ඉහත කී ප්‍රකාශනයෙන් පිළිගෙන ඇති අතර පළමු පාර්ශ්වයද සිය දිවුරුම් ප්‍රකාශය මගින් ඒ බව පිළිගෙන ඇත. තවද පළමු පාර්ශ්වය දිවුරුම් ප්‍රකාශය මගින් සාක්ෂි ලබා දෙමින් වැඩි දුරටත් ප්‍රකාශ කර ඇත්තේ ශ්‍රේෂ්ඨාධිකරණ අතුරු නියෝගය අනුව දැනටත් දෙවන පාර්ශ්වකරු වන අදාළ ආයතනයේ තමන් මුල් තනතුරේම පිහිටුවා දැනට සේවය ලැබ සේවය කරන බවත් ''නිවාස පහසුකම'' පමණක් නතර කර ඇති බවත් ඒ අනුව සේවා ගිවිසුමේ කොන්දේසියක් දෙවන පාර්ශ්වය විසින් සේවකයා සේවයේ යෙදවීම දිගින් දිගටම සිදුකර ඇතත් ගිවිසුමේ එක කොන්දේසියක් මත '' නිවාස හෝ ඒ පිළිබඳව පහසුකම් සැලසීම" යන කොන්දේසිය කඩකර ඇතිබව පෙනේ. එයට නිශ්චිත හේතු දැක්වීමක් ද දෙවන පාර්ශ්වය විසින් සිදු කර නැත. ඒ අනුව පළමු පාර්ශ්වය විසින් 2008 වසරේ සිට භුක්ති විඳි (ප්‍රකාශය සමග අමුණා ඇති ඇමුණුම 1 හා 2 ලේඛන වලින් තහවුරු කර ඇත. එමෙන්ම එකී ප්‍රතිලාභ දෙවන පාර්ශ්වකරු විසින් වසර ගණනාවක් පළමු පාර්ශ්වයට ලබාදී ඇත. තවද 2013 මැයි මස 31 දින දෙවන පාර්ශ්වයේ කළමනාකරණ රැස්වීමේදී ද නිවාස පහසුකම් සැපයීමේ අපහසුතා මත ඒ වෙනුවට ගෙවීමක් කිරීමට දෙවන පාර්ශ්වය එකඟව ඇත. එය ඉහත කී දිවුරුම් ප්‍රකාශය සමග අමුණා ඇති ඇමුණුම 3 ලේඛනයෙන් සනාථ වේ. මේ අනුව පළමු පාර්ශ්වයට එකී පහසුකම් සැලසීම කළ යුතු බව දෙවන පාර්ශ්වය විසින්ම තහවුරු කර ඇත. මේ හැර එකී පහසුකමක් සැලසීමට ඉහල කළමනාකාරිත්වය විසින්ද තහවුරු කර ඇති බව දිවුරුම් ප්‍රකාශයේ ඇමුණුම 04,05,05A ලේඛනවල පාද සටහන් වලින් තහවුරු වේ. එකී ලේඛනවල දැක්වෙන්නේ මෙම ගෙවල් කුලී දීමනාව ගෙවීමට කටයුතු කරන ලෙස අදාළ අංශ වලට කරන යොමු කිරීමය. තවද ඇමුණුම 6i, 6ii ලේඛනවලින් දක්වා ඇත්තේ එකී ගෙවල් කුලී දීමනාව ගෙවීම සම්බන්ධයෙන් භාණ්ඩාගාරයේ විරුද්ධත්වයක් නොමැති බවයි. තවද ඇමුණු 7 ලේඛනය මගින් දක්වා ඇත්තේ මහා භාණ්ඩාගාරයට වැය බරක් නොවී මෙම පහසුකම ලබාදීමට තමන්ට හැකියාවක් ඇති බව වේ. මේ අනුව පළමු පාර්ශ්වය සඳහා මුල් කාලයේ සිටම ''කුලී නිවාස පහසුකම'' හෝ ඒ වෙනුවෙන් යම් දීමනාවක් ලබා දීම දිගින් දිගටම සිදු කර ඇති බව පෙනී යන අතර එය පත්වීම් ලිපියේ කොන්දේසි මත මෙන්ම කළමණාකාරිත්වයේ උපදෙස් මත සිදුව ඇති බව පෙනේ. මේ අනුව සේවා කාලය තුල වැඩ තහනම් කර නැවත සේවයේ පිහිටුවීම මත කිසිදු සාධාරණ හේතුවක් නොදක්වා පත්වීම් ලිපියේ කොන්දේසි මත ලබා දුන් වරප්‍රසාද අහිමි කිරීම සාධාරණ නොවන බව තීරණය කරමි.

## ප්‍රදානය

01. ඉහත කී කරුණු සියල්ල සළකා බලා පළමු පාර්ශ්වයට නිවාස පහසුකම් හෝ ඒ වෙනුවට ලබාදුන් ගෙවල් කුලී අහිමි කිරීම වෙනුවෙන් පළමු පාර්ශ්වය විසින් හිඟ ගෙවල් කුලී දීමනාව වශයෙන් ඉල්ලා ඇති මුදල වන රුපියල් විසිහය ලක්ෂ හැත්තෑ දහසක (රු 26,70,000) මුදල ගෙවීමට දෙවන පාර්ශ්වයට නියෝග කරමි.

02. තවද 2022 ඔක්තෝබර් මාසයට පසුව පළමු පාර්ශ්වය තව දුරටත් සේවයේ යොදවා ඇත්නම් මසකට රු:30,000 බැගින් ගෙවල් කුලී දීමනාව නොකඩවා ගෙවන ලෙසත් දෙවන පාර්ශ්වයට නියෝග කරමි.

03. මෙම ප්‍රදානය *ගැසට්* පත්‍රයේ පළවී මාස 02 ක් ඇතුළත ක්‍රියාත්මක විය යුතුය. ඉහත කී ගෙවල් කුලී දීමනා මුදල පළමු පාර්ශ්වයට ගෙවීම පිණිස මහරගම දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ තැන්පත් කළ යුතුය.

04. තව ද මෙම නියෝගය සාධාරණ හා යුක්ති සහගත එකක් බව තීරණය කරමි.

**එච්. එම්. අනුලාවතී,**
බේරුම්කරු.

2024 අප්‍රේල් මස 29 වැනි දින,
කාර්මික අධිකරණයේ දී ය.

EOG 07 - 0044

මගේ අංකය: IR/COM/03/2021/79.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2023.03.27 දිනැති හා අංක 2325/02 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2023.03.20 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් බත්තරමුල්ල, වික්‍රමසිංහපුර, අංක 4/බී/98 හි පදිංචි එම්. කේ. ඒ. රංගන රත්නායක මහතා සහ කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, අංක 75, 12 වැනි මහල, ප්‍රධාන කාර්යාලයෙහි පිහිටි මහජන බැංකුව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/33/2023 හා 2024.05.07 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 ජූනි මස 30 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.**

එම්. කේ. ඒ. රංගන රත්නායක මහතා
අංක 4/බී/98, වික්‍රමසිංහපුර,
බත්තරමුල්ල.

සහ

අංක: A/33/2023.
IR/COM/03/2021/79.

මහජන බැංකුව
ප්‍රධාන කාර්යාලය,
12 වැනි මහල,
අංක 75, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,
කොළඹ 02.

1. **හැඳින්වීම**

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය ගරු මනුෂ නානායක්කාර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීම සඳහා බේරුම්කරුවකු වශයෙන් මා පත් කර ඇති බව කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින් අංක IR/COM/03/2021/79 සහ 2023.03.20 දාතම දරන ලිපිය මඟින් මා වෙත දන්වා එවා ඇත.

බේරුම්කරණය සඳහා ඉදිරිපත් කර ඇති ආරාවුල ලෙස දැක්වෙන්නේ "බඳවා ගනු ලැබූ සේවකයන් අතරින් එම්. කේ. ඒ. රංගන රත්නායක මහතා පමණක් කොන්ත්‍රාත් ගිවිසුම අවසානයේ දී ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය නොකිරීමෙන් අසාධාරණයක් සිදුවී තිබේද යන්නත්, එසේ අසාධාරණයක් සිදුවී තිබේනම් හිමිවිය යුතු සහනයන් කවරේද යන්නත්" පිළිබඳව වේ.

ඒ අනුව එම ආරාවුල බේරුම් කිරීම සඳහා 2023.04.17 දින පැමිණ සහභාගිවන ලෙස දන්වමින් සහකාර කම්කරු කොමසාරිස් විසින් අංක A/33/2023 හා 2023.03.22 දාතම දරන ලිපිය මඟින් දැනුම් දෙන ලදුව, නියමිත පරිදි දෙපාර්ශ්වයම 2023.04.17 දින

තම නියෝජිතයන් සමග පැමිණ සිටි අතර පළමුවන පාර්ශ්වය වන එම්. කේ. ඒ. රංගන මහතා වෙනුවෙන්, නීතිඥ කේ. ජී. ජිනසේන මහතා සහ නීතිඥ විකුම් ජයනාත් මහතා ද, දෙවන පාර්ශ්වය වන මහජන බැංකුව වෙනුවෙන් නීතිඥ සී. බී. ආර්. දල්පදාදු මහතා සමග නීති නිලධාරි කුමාරි ප්‍රනාන්දු මහත්මිය ද, නියෝජ්‍ය කළමනාකරු මානව සම්පත් පී. එල්. ඒ. එස්. වීරසූරිය මහතා ද, පෙනී සිටියහ.

ඒ අනුව දෙපාර්ශ්වයේ එකඟත්වය ඇතිව, 2023.06.05, 2023.07.04, 2023.07.18, 2023.07.27 හා 2023.08.07 දිනවල සාක්ෂි විමසීම් කරන ලද අතර, 2023.07.12 දිනට පෙර ලිඛිත දේශන ඉදිරිපත් කිරීමට එකඟවන ලදී.

ඒ අනුව දෙවන පාර්ශ්වය ද 2023.04.17 දින ද, පළමුවන පාර්ශ්වය 2023.05.26 දින ද තම තමන්ගේ පළමුවන ප්‍රකාශයන් ඉදිරිපත් කර ඇත.

පළමුවන පාර්ශ්වය තම පළමුවන ප්‍රකාශය සමග A1 සිට A8 දක්වා ලේඛන ඉදිරිපත් කර ඇති අතර, දෙවන පාර්ශ්වය විසින් තම පළමුවන ප්‍රකාශය සමග R1 සිට 15 දක්වා ද, (R 12) වශයෙන් ලේඛනයක් ඉදිරිපත් වී නැත.) ලේඛන ඉදිරිපත් කර ඇත. බේරුම්කාර මණ්ඩලය ඉදිරියේ පළමුවන පාර්ශ්වය වෙනුවෙන් රංගන රත්නායක මහතාගෙන් ද දෙවන පාර්ශ්වය වෙනුවෙන් විමර්ශන කළමනාකාර කේ. කේ. එස්. ප්‍රියන්ත මහතාගෙන් ද, සාක්ෂි විමසන ලදී.

2. **පසුබිම**

පළමුවන පාර්ශ්වය වන එම්. කේ. ඒ. රත්නායක මහතා විසින් තම පළමුවන ප්‍රකාශය ලෙස ඉදිරිපත් කරන ලද 2023.05.26 දිනැති දිවුරුම් පෙත්සම මගින් සඳහන් කර ඇති පරිදි පැමිණිල්ලේ සාරාංශය මෙසේය.

රංගන රත්නායක මහතා මහජන බැංකුවේ ජාත්‍යන්තර අංශයේ පාලන දෙපාර්තමේන්තුවේ සේවයේ නිරතව සිටියදී, 2018.11.26 දින පෙ.ව. 9.00 සිට ප.ව. 1.10 අතරතුර වේලාවකදී, තම අත්දෙකෙන් නියෝජ්‍ය කළමනාකරුවකු වන අයි. එම්. ඩී. ඩබ්. බණ්ඩාර මහතාගේ ගෙල සිරකර සෙළවීමට සහ/හෝ බිමට තල්ලු කිරීම හා/හෝ පහරදීම හෝ පහරදීමට තැත්කිරීම සහ නැවතත්, එම දෙපාර්තමේන්තුව තුළ තිබූ Epson Fx 2190 වර්ගයට අයත් ප්‍රින්ටර් යන්ත්‍රයක් ඔසවා ඔහුට පහරදීමට තැත් කළ බවට වූ පැමිණිල්ලක් අනුව, ඒ පිළිබඳ මූලික විමර්ශනයක් කර රංගන මහතා වෙත චෝදනා පත්‍රයක් ඉදිරිපත් කර ඇති (ඇමුණුම A.04) අතර, රංගන මහතා එම චෝදනා පත්‍රයට දීර්ඝ පිළිතුරක් (ඇමුණුම A.05) යවමින් තම නිර්දෝෂිභාවය ප්‍රකාශ කර ඇත.

ඒ සම්බන්ධයෙන් 2019.05.07 දින පැවති සහකාර සාමාන්‍යාධිකාරි කමිටුවක් විසින් රංගන රත්නායක මහතා සම්බන්ධයෙන් පවත්වන ලද මූලික විමර්ශන වාර්තාව ද, ඔහු වෙත නිකුත් කරන ලද චෝදනා පත්‍රය ද, එම චෝදනා පත්‍රයට රංගන රත්නායක මහතා ඉදිරිපත් කරන ලද පිළිතුර ද, ඒ සම්බන්ධයෙන් තවත් සහකාර සාමාන්‍යාධිකාරි කමිටුවක් විසින් ඉදිරිපත් කරන ලද 2019.02.21 දිනැති කමිටු වාර්තාවක් ද, සැළකිල්ලට ගනිමින් වාර්තාවක් (ඇමුණුම R.06) ඉදිරිපත් කර තිබූ අතර, එම සහකාර සාමාන්‍යාධිකාරි කමිටු වාර්තාව මගින් නිර්දේශ කර තිබුණේ රංගන රත්නායක මහතාට 2018.11.26 දින සිට බලපැවැත්වෙන පරිදි අවවාද කිරීමට හා ඉදිරියේදී එවැනි වැරදි සිදුකළහොත් සේවා ගිවිසුම අවලංගු කිරීම/සේවයෙන් පහ කිරීම බඳු වූ විනය පියවරක් ගැනීමට සිදුවන බවට අවධාරණය කරමින් රංගන රත්නායක මහතා උපදේශනයට ලක්කරන ලෙසය.

ඒ අනුව ප්‍රධාන කළමනාකරු (මානව සම්පත්) විසින් 2019.06.18 දාතම දරන ලිපිය මගින් විනය නියෝගයක් (ඇමුණුම R.02) නිකුත් කරමින් රංගන රත්නායක මහතාට දන්වා ඇත්තේ, 2018.11.26 දින සිට බලපැවැත්වෙන පරිදි තරයේ අවවාද කරන බවත්, ඉදිරියේදී එවැනි වැරදි සිදුකළහොත් සේවා ගිවිසුම අවලංගු කිරීම/සේවයෙන් පහ කිරීම බඳු වූ විනය පියවරක් ගැනීමට සිදුවන බවත්, රංගන රත්නායක මහතා උපදේශනයට ලක්කිරීමට කටයුතු කරන බවත්ය.

ඉක්බිති 2019.09.02 දින රැස් වූ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි අභියාචනා කමිටුව (ඇමුණුම R.07) මේ සම්බන්ධයෙන් සළකා බලා රංගන රත්නායක මහතාගේ සේවා ගිවිසුම අවලංගු කිරීමට නිර්දේශ කර ඇත. ඒ අනුව A.07 මගින් 2020.07.02 දින සිට සේවය අත්හිටුවන බව දන්වා යවා ඇත.

ඒ අතරතුර, කොන්ත්‍රාත් පදනම මත නිශ්චිත කාලසීමාවක් සඳහා සේවය ලබාගෙන සිටි කාර්යාල සහායකයින්ගෙන්, යහපත් සේවා වාර්තා සහිත, බැංකුවේ ව්‍යාපාරික කටයුතු සඳහා සුදුසු සේවකයින් බැංකුවේ ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය කිරීමට බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කොට, එකී අවශ්‍යතාවයන් සපුරන ලද යහපත් සේවා වාර්තා සහිත සේවකයින් බැංකුව වෙත ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය කිරීමට කටයුතු කොට තිබුණි.

ඒ අනුව රංගන රත්නායක මහතාට බැංකුවේ ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය වීමට තිබූ අවස්ථාව අහිමිවීම හේතුකොට ගෙන ඔහු ඉහත සඳහන් කරන ලද පරිදි "බඳවා ගනු ලැබූ සේවකයන් අතරින් තමාට කොන්ත්‍රාත් ගිවිසුම අවසානයේ දී ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය නොකිරීමෙන් අසාධාරණයක් සිදුවී ඇති බව දන්වමින් ඉහත පැමිණිල්ල ඉදිරිපත් කර ඇත.

පළමුවන පාර්ශ්වකරු ඉදිරිපත් කර ඇති පැමිණිල්ලේ මෙන්ම දෙවන පාර්ශ්වයේ පිළිතුරුවලට ප්‍රති පිළිතුරු මගින් ඉදිරිපත් කර ඇති දිවුරුම් පෙත්සමේ සඳහන් කර ඇති පරිදි, තමාට සිදුවූ අසාධාරණය ඔහු පැහැදිලි කරන්නේ, තමාට එරෙහිව සිදු කරන ලද විනය ක්‍රියා මාර්ගය අසාධාරණ එකක් බවත්, ඒ සම්බන්ධයෙන් දෙන ලද විනය නියෝගය අසාධාරණ බවත්, ඒ මත පදනම් වෙමින්, තමා හැර, තමා සමග, කොන්ත්‍රාත් පදනම මත සේවයට බඳවා ගත් සෙසු සියලුදෙනා ස්ථිරව සේවයට බඳවා ගැනීමට ක්‍රියා කිරීම, තමාට කරන ලද බලවත් අගතියක් බවත්ය.

ඔහුගේ පැමිණිල්ල සම්බන්ධයෙන් බේරුම්කරණයක් කිරීමේ දී, ඔහුට අසාධාරණයක් සිදු වී ඇත්ද යන්න තීරණය කිරීමේ දී ඉහත සඳහන් කළ කරුණු සියල්ල පිළිබඳව සැළකිල්ල යොමු කළ යුතුව ඇත.

3.0 **සාක්ෂි විශ්ලේෂණය, නිරීක්ෂණ/නිගමන**

3.1 **විනයානුකූලව ක්‍රියා කිරීම සඳහා පදනම් වූ මූලික කරුණු යුක්ති සහගත සාධාරණ ඒවා වී ද,**

පහත සිද්ධිය පිළිබඳව බණ්ඩාර මහතා විසින් පැමිණිලි කිරීමෙන් පසු, ඒ පිළිබඳව එදිනම, එනම් 2018.11.26 දිනම ප්‍රධාන කළමනාකාර (ණය පරිපාලන හා පාලන) බී. ඩී. ජී. ආර්. මෙන්දිස් මහතා විසින් මූලික විමර්ශනයක් සිදුකර, එම වාර්තාව 2019.01.14 දින භාරදී ඇති අතර එකී වාර්තාව අනුව ඒ සම්බන්ධයෙන් මූලික විමර්ශනයේ දී ප්‍රකාශයක් ලබා දෙන ලදි. ඒ. එම්. පී. ඩබ්. පෙරේරා මහතා ප්‍රකාශයක් කරමින් සඳහන් කර ඇත්තේ, රංගන රත්නායක මහතා පොටෝ කොපි යන්ත්‍රය භාවිතා කරමින් සිටියදී බණ්ඩාර මහතා ඒ පිළිබඳව උපදෙස් ලබා දුන් බවත්, එසැනින් රංගන රත්නායක මහතා බණ්ඩාර මහතාගේ ගෙල හා කර ප්‍රදේශයෙන් අල්ලා හිංසනයට ලක් කළ බවත්, ඔහු (බණ්ඩාර මහතා) විසින් වහාම ක්‍රියාත්මක වී රංගන රත්නායක මහතා එම ස්ථානයෙන් බැහැර කළ බවත් එවිට රංගන රත්නායක මහතා විසින් ප්‍රින්ටරය ඔසවා පහරදීමට උත්සාහ කළ බවත්ය. **(ඇමුණුම R.06 - පිටුව 191).**

ඒ සම්බන්ධයෙන් මූලික විමර්ශනයේ දී ප්‍රකාශයක් කරමින් **ආර්. පී. විශ්වජිත් මහතා** සඳහන් කර ඇත්තේ, පොටෝ කොපි යන්ත්‍රය භාවිතා කිරීමට පැමිණිලිකරු (රංගන රත්නායක මහතා)ට උපදෙස් ලබාදීමේදී ඔහු කෝප වී බණ්ඩාර මහතාගේ ගෙල සිරකිරීමට උත්සාහ කරන ලද බවත්, ප්‍රින්ටරය ඔසවා පහරදීමට උත්සාහ කළ බවත්ය. **(ඇමුණුම R.06 - පිටුව 191).**

එම විමර්ශනයේදී, විමර්ශන නිලධාරියා විසින් සාක්ෂි වශයෙන් ලබාගන්නා ලද ප්‍රකාශ හෝ විමර්ශන වාර්තාව හෝ බේරුම්කරණයේදී ඉදිරිපත් වී නැත. එබැවින් පළමුවන පාර්ශ්වකාර පැමිණිලිකරුට චෝදනා පත්‍රයක් නිකුත් කිරීමට තරම් ප්‍රමාණවත් කරුණු තිබුණේ ද යන්න පිළිබඳව සාක්ෂි බේරුම්කරණයේදී ඉදිරිපත් වූයේ නැත.

කෙසේ වෙතත් එකී මූලික විමර්ශනය පදනම් කරගෙන පළමුවන පාර්ශ්වකාර මහජන බැංකුව විසින් පළමුවන පාර්ශ්වකාර පැමිණිලිකරුට පහත සඳහන් පරිදි චෝදනා පහකින් සමන්විත චෝදනා පත්‍රයක් **(A.04 - පිටුව 43)** නිකුත් කර ඇත.

1. මහජන බැංකුවේ ජාත්‍යන්තර බැංකු අංශයේ පාලන දෙපාර්තමේන්තුවේ සේවයේ නිරතව සිටින නියෝජ්‍ය කළමනාකරුවකු වන අයි. එම්. සී. ඩබ්. බණ්ඩාර මහතා (සේවා අංක 12701-9) හට 2018.11.26 දින පෙ.ව. 9.00 සිට පෙ.ව. 10.00 අතරතුර වේලාවකදී එම දෙපාර්තමේන්තුව තුළදී ඔබ විසින් ඔබගේ අත් දෙකෙන් ඔහුගේ ගෙල සිරකර සෙලවීම හා/හෝ බිමට තල්ලු කිරීම හා/හෝ පහරදීමට තැත් කිරීම.

2. ඉහත අංක 1 චෝදනාවේ විස්තර සඳහන් කර ඇති පරිදි අප විසින් නීති විරෝධී ලෙස කටයුතු කිරීමෙන් අනතුරුව එම ස්ථානයෙන් ඉවත්ව යන අවස්ථාවේදී නැවත එම පාලන දෙපාර්තමේන්තුව තුළ තිබූ Epson FX 2190 වර්ගයට අයත්, ''ප්‍රින්ටර්'' යන්ත්‍රයක් ඔසවා නියෝජ්‍ය කළමනාකාර අයි. එම්. සී. ඩබ්. බණ්ඩාර (සේවා අංක 12701 - 9) මහතාට පහරදීමට ඔබ විසින් තැත් කිරීම.

3. ඉහත අංක 1 සහ අංක 2 චෝදනාවල විස්තර සඳහන් කර ඇති පරිදි ඔබ විසින් ඔසවා නියෝජ්‍ය කළමනාකාර අයි. එම්. සී. ඩබ්. බණ්ඩාර මහතාගේ (සේවා අංක 12701 - 9) ගෙල සිරකර සොලවමින් හා/හෝ බිමට තල්ලු කරමින් හා/හෝ පහරදීමට තැත් කරන අවස්ථාවේදී එසේ පහරදීම වැළැක්වීමට උත්සාහ කළ පාලන දෙපාර්තමේන්තුවේ සේවය කරන ආර්. ඩී. ජී. විශ්වජිත් මහතාගේ (සේවා අංක 14868 - 8) වාහනයට ද අලාභහානි කරන බවට සහ ''පිටතදී හමුවී බලාගමු'' යනුවෙන් පවසමින් ජී. විශ්වජිත් මහතාට ඔබ විසින් තර්ජනය කිරීම.

4. ඉහත අංක 1 සිට අංක 3 දක්වා වූ චෝදනාවල සඳහන් විෂමාචාරයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ල සිදුකිරීම මගින් සේවක චක්‍රලේඛ අංක 326/2002 දරන මහජන බැංකුවේ විනය රීති සංග්‍රහයේ II වන උපලේඛනයේ සඳහන් අංක 01, අංක 02, අංක 10, අංක 13, අංක 21, අංක 22, අංක 28 සහ අංක 540 යන බරපතල විෂමාචාරයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම ඔබ විසින් සිදුකිරීම.

5. ඉහත අංක 1 සිට අංක 04 දක්වා චෝදනාවල සඳහන් විෂමාචාරයන් එකක් හෝ කිහිපයක් හා සියල්ලම ඔබ විසින් සිදුකිරීම මගින් මහජන බැංකු කාර්ය මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් මහජන බැංකුව ඔබ වෙත තබා තිබූ විශ්වාසය ඔබ විසින් බරපතල ලෙස කඩ කිරීම.

එම චෝදනා පත්‍රයට දීර්ඝ පිළිතුරක් (A.05-පිටුව 45) දෙමින් පළමුවන පාර්ශ්වකාර පැමිණිලිකරු විසින් එකී චෝදනා ප්‍රතික්ෂේප කරමින් සඳහන් කර ඇත්තේ නියෝජ්‍ය කළමනාකරු බණ්ඩාර මහතා තමාට උස් හඬින් කථා කිරීම හේතුකොටගෙන ඇතිවූ ආවේගය නිසා බණ්ඩාර මහතාගේ කමිස කොළරයෙන් ඇල්ලූ බව තමා පිළිගන්නා බවත්, එහෙත් මුද්‍රණ යන්ත්‍රයක් ඔසවා තමා පහර නොදුන් බවත්, තමන් විසින් සිතාමතා නොකරන ලද එම ක්‍රියාවට සමාව ලබාදෙන ලෙස ඉල්ලා සිටින බවත්ය. එම ලිපියේ මෙසේද සඳහන් කර ඇත.

''එම අවස්ථාවේදී බණ්ඩාර මහතා මා හට උස් හඬින් කතා කිරීම නිසා ක්ෂණිකව ආවේග වූ මා ඔහුගේ කමිස කොළරයෙන් ඇල්ලුවෙමි. මෙය මා සිතා මතා කළ දෙයක් නොවන අතර, ඔහු උස් හඬින් කතා කිරීම නිසා ඇතිවූ ආවේගශීලී ගතියයි. කෙසේ වෙතත්, මේ සම්බන්ධයෙන් දැඩි ලෙස කණගාටු වන අතර, මේ සම්බන්ධව බණ්ඩාර මහතාගෙන් ද, බැංකුවෙන් ද සමාව අයදිමි. මේ සම්බන්ධව ඔබතුමා සානුකම්පිතව සලකා බලනු ඇතැයි බලාපොරොත්තු වෙමි.'' (A.05-පිටුව 45)

දෙවැනි චෝදනාවේ සඳහන් පරිදි මුද්‍රණ යන්ත්‍රයෙන් බණ්ඩාර මහතා වෙත පහරදීමට මා තැත් නොකළෙමි. තවද ඒ අවස්ථාවේදී බණ්ඩාර මහතා කී දේ අනුව මාගේ කෝපය ඇවිස්සීම නිසා ක්ෂණිකව අසල තිබූ මුද්‍රණ යන්ත්‍රය එසවුවද, එයින් ඔහුට පහරදීමට තැත් නොකළෙමි. කෙසේ වෙතත්, ඒ පිළිබඳව බණ්ඩාර මහතාගේ සිත් රිදවීමක් වුනි නම්, අතිශයින් කණගාටු වෙමි. (ඇමුණුම A.05- 47 පිටුව)'

ඒ අනුව පළමුවන පාර්ශ්වකාර පැමිණිලිකරු වෙත චෝදනා පත්‍රයක් නිකුත් කිරීමට තරම් ප්‍රමාණවත් කරුණු නොතිබුණු බව බේරුම්කරු පිළිගනී.

**3.2 බඳවා ගනු ලැබූ සේවකයන් අතරින් පළමුවන පාර්ශ්වකරු එම්. ඒ. කේ. රංගන රත්නායක මහතාගේ පමණක් කොන්ත්‍රාත් ගිවිසුම අවසානයේ දී සේවය අතිහිටුවීම යුක්ති සහගතද?**

එකී පැමිණිලිකරුගේ ඉහත සඳහන් කළ පිළිතුරු ලිපිය සහකාර සාමාන්‍යාධිකාරී කමිටුවට (සේවක කමිටුවට) ඉදිරිපත් කර ඇති අතර, (විනය රීති සංග්‍රහය 2.22) එකී කමිටුව 2019.05.07 දින රැස් වී නිර්දේශ කර ඇත්තේ (ඇමුණුම R.06 A - 193 පිටුව) ''ඉදිරියේදී මෙවැනි වැරදි සිදු කළහොත් සේවා ගිවිසුම අවලංගු කිරීම/සේවයෙන් පහකිරීම බඳු වූ දැඩි දඬුවමක් ලබාදීමට සිදුවන බව දැනුම් දෙමින් දන්වමින් උපදේශනයට ලක්කිරීම'' සහ ''2018.11.26 දින සිට තරයේ අවවාද කිරීම'' කරන ලෙසටය.

එසේම එම නිර්දේශයේ මෙසේද සඳහන් කර ඇත.

**14.2 ප්‍රධාන කළමනාකාර - මානව සම්පත්**

**14.2.1 ඉදිරියේදී මෙවැනි වැරදි සිදුකළහොත්, සේවා ගිවිසුම අවලංගු කිරීම/සේවයෙන් පහකිරීම බඳුවූ දැඩි දඬුවමක් ලබාදීමට සිදුවන බව දැනුම් දෙමින් උපදේශනයට ලක් කිරීම.**

**14.2.2 එම්. කේ. ඒ. රත්නායක මහතාගේ සේවය ස්ථිර කිරීමේදී ඔහුගේ මානසික සෞඛ්‍ය තත්ත්වය පිළිබඳව විශේෂයෙන් සළකා බැලීම.**

ඒ අනුව, ඒ බව දන්වමින් ප්‍රධාන කළමනාකාර (මානව සම්පත් ) විසින් අංක ප්‍රකළ (මා.ස) 1/9/1 - 8313/16/19/23/කේඑච් - තුයි සහ 2019.06.18 දිනැති විනය නියෝගය රංගන රත්නායක මහතාට ලබා දී ඇත. (ඇමුණුම R.02- 182 පිටුව) නමුත් සහකාර සාමාන්‍යාධිකාරී කමිටුව විසින් ප්‍රධාන කළමනාකාර (මානව සම්පත්) වෙත ලබාදී ඇති ඉහත නිර්දේශය කෙරෙහි ප්‍රධාන කළමණාකරු අවධානය යොමු කර නැත.

එසේ වුවද, සහකාර සාමාන්‍යාධිකාරී කමිටුවට (සේවක කමිටුව) විසින් ප්‍රධාන කළමනාකාර (මානව සම්පත්) වෙත ලබා දී ඇති නිර්දේශය නොසළකා හැරිය නොහැකිය. මන්ද යත් එම නිර්දේශයේ එම්. කේ. ඒ. රංගන රත්නායක මහතාගේ සේවය ස්ථිර කිරීමේදී ඔහුගේ මානසික සෞඛ්‍ය තත්ත්වය පිළිබඳව විශේෂයෙන් සළකා බැලීම'' යනුවෙන් ගම්‍ය වන්නේ, පළමුවන පාර්ශ්වකාර පැමිණිලිකරුගේ සේවය ස්ථිර කිරීමේදී ඔහුගේ මානසික සෞඛ්‍ය තත්ත්වය පිළිබඳව විශේෂයෙන් සළකා බලන ලෙස මිස, සේවා ගිවිසුම අවසන් කිරීම සඳහා මෙහෙයවීමක් නොවන නිසාය.

සේවකයකුට එරෙහිව විනයානුකූල ක්‍රියා මාර්ගයක් ගැනීමේදී, මූලික විමර්ශනයක් සිදු කිරීම, එම මූලික විමර්ශනයේදී එම සේවකයාට එරෙහිව බැලූ බැල්මට පෙනී යන විෂමාචාර ක්‍රියාවක් අනාවරණය වී ඇත්නම්, විෂමාචාර ක්‍රියාවන් පිළිබඳව චෝදනා පත්‍රයක් සකස් කිරීම හා එම චෝදනා පත්‍රය, චෝදනා ලබන අදාළ සේවකයාට යොමුකර පිළිතුරක් දීමට අවස්ථාවක් ලබාදීම, යන ක්‍රියාවන් සිදුකිරීම, අත්‍යාවශ්‍ය වැදගත් මූලිකාංග වන බව නිසැකය.

ඒ අනුව, ප්‍රස්තුත සිද්ධියේදී පළමුවන පාර්ශ්වකරු විසින් සිදුකරනු ලැබූවායයි කියනු ලබන විෂමාචාර ක්‍රියාව පිළිබඳව දෙවන පාර්ශ්වය මූලික විමර්ශනයක් පවත්වා ඇති බවත්, ඒ අනුව චෝදනා පත්‍රයක් නිකුත් කර ඇති බවත්, බේරුම්කරු වෙත ඉදිරිපත් කර ඇති (R 6) ලේඛනය මගින් අනාවරණය වුවද, මූලික විමර්ශන වාර්තාව බේරුම්කරු වෙත ඉදිරිපත් කරනු ලැබුවේ නැත.

මහජන බැංකුවේ විනය රීති මාලාවේ 2:22 හා 9 වන වගන්තිය අනුව පෙනී යන්නේ මූලික විමර්ශනයක් කිරීමෙන් අනතුරුව මූලික විමර්ශන වාර්තාවෙන් හෙළිවන කරුණු පිළිබඳව ඇගයීම් කිරීම සඳහා ''සේවක කමිටු'' රැස්වන බවය. එහෙත් ප්‍රස්තුත සිද්ධියේදී සේවක කමිටුවට අදාළ කරුණු වාර්තාකර ඇත්තේ, චූදිත නිලධාරියාට චෝදනා පත්‍රයක් නිකුත් කර, (2019.04.11) එකී චෝදනා පත්‍රයට, චූදිත නිලධාරියා විසින් පිළිතුරු දීමෙන් (2019.04.24) පසුවය. එනම් සේවක කමිටුව රැස්වී ඇත්තේ 2019.05.07 වන දිනයේ දී ය.

සැබවින්ම එම කමිටුව රැස්වී ඇත්තේ සේවක කමිටුවක් ලෙසද යන්න සඳහන් නොවන අතර එය නම්කර ඇත්තේ ද, සහකාර සාමාන්‍යාධිකාරි කමිටු රැස්වීමක් ලෙසය. විනය රීති මාලාවේ 9.1.3 වන වගන්තියෙහි දැක්වෙන පරිදි, ආයතනික සේවක කමිටුවක සංයුතිය සඳහන් කර ඇත්තේ "සහකාර සාමාන්‍යාධිකරිවරයෙක් සහ පළමුවන ශ්‍රේණියේ නිළධාරින් දෙදෙනෙකුගෙන් සමන්විත වන බවය. (සාමාන්‍යාධිකාරීවරු තිදෙනෙක්ම සහභාගි විය හැකි බවක් සඳහන් වන්නේ නැත).

එපමණක් නොව.(R6) ලේඛනයෙහි 13 වන ඡේදයෙහි 2019.02.21 දිනැති සහකාර සාමාන්‍යාධිකාරි කමිටුව විසින්, දෙන ලද නිරීක්ෂණ හා නිර්දේශ පිළිබඳව සලකා බැලීමක් කළ බවද, 14 වන ඡේදයෙහි 2019.05.07 දිනැති සහකාර සාමාන්‍යාධිකාරි කමිටුව විසින්,2019.02.21 දිනැති සහකාර සාමාන්‍යාධිකාරි කමිටුවක නිරීක්ෂණ හා නිර්දේශ පිළිබඳව සලකා බැලීමක් සිදුකර ඇති බවද සඳහන් කර ඇතත්. එකී කමිටුව කුමන අරමුණකින් එකී කමිටු රැස් වූයේද යන්න හෝ නිර්දේශ ලබා දුන්නේද යන්න හෝ එම කමිටු ක්‍රියාකර ඇත්තේ විනය රීති මාලාවේ කිනම් වගන්තියක් යටතේද යන්න හෝ, සඳහන් නොවන අතරම, එම වාර්තා බේරුම්කරණයේදී බේරුම්කරු වෙත ඉදිරිපත් වූයේ හෝ, නැත. ඒ හැරත්, එම කමිටු රැස්වී ඇත්තේ චූදිත නිලධාරියාට චෝදනා පත්‍රය නිකුත් කර ඇති දිනට (2019.04.11 දිනට) පෙර දිනකය. එයද කර ඇත්තේ සේවක කමිටුවක් ලෙස නොව සහකාර සාමාන්‍යාධිකාරි කමිටුවක් ලෙසය.

කෙසේ වෙතත්, 2019.05.07 දින රැස්වී ඇති කමිටුව විසින්, එකී 2019.02.21 දින රැස් වූ කමිටුවේ නිරීක්ෂණ හා නිර්දේශ සමඟ චූදිත නිලධාරියා විසින් ඉදිරිපත් කර ඇති පිළිතුරු ද සැළකිල්ලට ගෙන චූදිත නිලධාරියාට විනය නියෝගයක් නිකුත් කිරීමට නිර්දේශ කර ඇත.

එම විනය නියෝගය නිකුත් කර ඇත්තේ මානව සම්පත් ප්‍රධාන කළමනාකරු විසිනි. පළමුවන පාර්ශ්වකරුට එරෙහිව විනය නියෝගයක් නිකුත් කිරීම සඳහා මානව සම්පත් කළමනාකරුට බලයක් තිබුණේද යන්න පිළිබඳව පළමුවන පාර්ශ්වය වෙනුවෙන් ඔහුගේ නීතිඥයා (ඩී.කේ. විකුම් ජයනාත් මහතා) විසින්, දින තුනක් තිස්සේ මානව සම්පත් අංශයේ ප්‍රධාන කළමනාකරු, නන්දන ප්‍රියන්ත මහතාගෙන් ප්‍රශ්න කරන ලද නමුත්, ඔහුට ඒ පිළිබඳව පිළිගත හැකි පිළිතුරක් ලබාදීමට හැකියාවක් නොවූ බව, බේරුම්කරු නිරීක්ෂණය කරන ලදී.

ප්‍රශ්නගත සිද්ධියේදී චූදිත නිලධාරියා වූ පළමුවන පාර්ශ්වකරුට එරෙහිව මානව සම්පත් අංශයේ ප්‍රධාන කළමනාකරු විසින් නිකුත් කරන ලද ඉහත සඳහන් කළ 2019.06.18 දිනැති විනය නියෝගය සම්බන්ධයෙන් කිසිදු අභියෝගයක් හෝ අභියාචනයක් කළ බවත්, පළමුවන පාර්ශවකරු හෝ දෙවන පාර්ශවකරු හෝ බේරුම්කරණයට ඉදිරිපත් කළ ලිපි ලේඛන මගින් හෝ බේරුම්කරු ඉදිරියේ පැවති සාක්ෂි විභාගයේදී හෝ අනාවරණය කර නැත. එහෙයින් එම විනය නියෝගය සම්බන්ධයෙන් පළමුවන පාර්ශ්වය විසින් එකඟතාවය දක්වා ඇති බව බේරුම්කරු පිළිගනී.

මේ සම්බන්ධයෙන් පළමුවන පාර්ශ්වකරු විසින් දෙවන පාර්ශ්වකරු සමග අත්සන් කරන ලද සේවා ගිවිසුමේ(R1) අන්තර්ගත විධිවිධාන වලින් ප්‍රස්තුත කරුණ සම්බන්ධයෙන් අදාළ වන විධිවිධාන කිහිපයක් පහත දක්වමි.

මෙම සේවා ගිවිසුමේ කාල පරිච්ඡේදය, 2017.07.03 වන දින ආරම්භ කොට, 2020.07.02 වන දින දක්වා අවුරුදු (03) තුනක් වූ නිශ්චිත වූ සහ දීර්ඝ කළ නොහැකි කාලයක් සඳහා, පළමුවන පාර්ශ්වකාර පාර්ශ්වය විසින් කාර්යාල කාර්ය සහායක තනතුරයට පත්කිරීම සඳහා වූ නියමයන් සහ කොන්දේසි වඩාත් හොඳින් පැහැදිලිව දැක්වීම සඳහා ඉහත සඳහන් කාර්යාල කාර්ය සහායක කොන්ත්‍රාත් තනතුරට පත්කිරීම සඳහා මෙම ගිවිසුමට එළඹීමට මෙම ගිවසුමේ පාර්ශ්වකරුවන් අපේක්ෂා කරන හෙයින් ද,

"මෙහි පළමුවන පාර්ශ්වකාර පාර්ශ්වය විසින් දෙවන පාර්ශ්වකාර පාර්ශ්වය පත්කරනු ලබන නිශ්චිත කාල පරිච්ඡේදයක් වන 2017.07.03 වන දිනෙන් ආරම්භ වී 2020.07.02 වන දිනෙන් අවසන් වන අවුරුදු තුනක (03 වන කාල පරිච්ඡේදයක් සඳහා ඉහත සඳහන් කාර්යාල සහයක කොන්ත්‍රාත් තනතුරට පළමුවන පාර්ශ්වකාර පාර්ශ්වය විසින් දෙවන පාර්ශ්වකාර පාර්ශ්වය පත්කර ගැනීම සඳහා වූ නියමයන් සහ කොන්දේසි මෙහි දක්වමින් හා එකිනෙකා බැඳෙමින් පාර්ශවකරුවන් ඊට එකඟ වන බවට මෙම ගිවිසුම සාක්ෂි දරයි. ''(පූර්විකාව- තුන හතර සහ පහ ඡේද ගොනුවේ 14 පිටුව)

"මෙම සේවා ගිවිසම අවුරුදු (03) තුනක නිශ්චිත කාල පරිච්ඡේදයක් සඳහා වන බවටත්, අවුරුදු (03) තුනක් වන එකී පරිච්ඡේදය අවසන් වූ විට, අවුරුදු (03) තුනක් වන එම නිශ්චිත කාල පරිච්ඡේදය අලුත් සහ / හෝ දීර්ඝ කළ නොහැකි බවටත්, මෙම ගිවිසුමේ පාර්ශවකරුවන් විසින් සහ අතරේ ගිවිසගනු ලැබේ. මෙම ගිවිසුමේ, පූර්වෝක්ත නිශ්චිත අවුරුදු (03) තුනක කාල පරිච්ඡේදය. මෙහි මීලඟට ඇති ඡේදයේ විධිවිධාන සලස්වා ඇති පරිදි, 2017.07.03 වන දිනෙන් ආරම්භ විය යුතු අතර, 2020.07.02 වන දිනෙන් අවසන් විය යුතුය.((3 - අ) ඡේදය ගොනුවේ 15 පිටුව)

" විනය පටිපාටියට අදාලව පහත දැක්වෙන කරුණු ද ඇතුලුව බැංකුවේ මොනයම් හෝ චක්‍රලේඛ උපදෙස් සහ/ හෝ වෙනයම් ලිඛිත උපදෙස් සහ/හෝ රීති සහ රෙගුලාසි උල්ලංඝනය කීරීමක් සිදුවූ අවස්ථාවකදී දෙවන පාර්ශවයේ සේවය අවසන් කිරීමේ අයිතිය පළමුවන පාර්ශ්වය තබාගනු ඇත. (ඇ) අවසන් කිරීම පළමුවන ඡේදය ගොනුවේ 16 පිටුව)

"විෂමාචාරය, වංචාව, අණට අකීකරුවීම සහ / හෝ මෙම නිශ්චිත සේවා ගිවිසුමෙහි යම් ප්‍රකාශිත හෝ ගම්‍යමාන නියමයන්/ කොන්දේසියක් උල්ලංඝනය කිරීම සහ / හෝ ඉහත කී දෙවන පාර්ශ්වයේ වගකීම් ඉටු කිරීමට අසමත්වීම, එම අසමත්වීම හිතාමතාම හෝ නොසැළකිල්ලෙන් වුවද, දෙවන පාර්ශ්වකාර පාර්ශ්වයට කිසිදු දැන්වීමක් නොකර හෝ දැන්වීම් වෙනුවට කිසියම් ගෙවීමක් නොකොට දෙවන පාර්ශ්වකාර පාර්ශ්වයේ සේවය පළමුවන පාර්ශ්වකාර පාර්ශ්වය විසින් අවසන් කළ හැකිය. එතෙකුදු වුවද එකී අසමත්වීම, හිතාමතාම හෝ නොසැළකිල්ලෙන් සිදුවුවක් වුවද එය හේතුකොටගෙන, දෙවන පාර්ශ්වකාර පාර්ශ්වයේ සේවය තවදුරටත් රඳවා තබා ගැනීම, පළමුවන පාර්ශ්වකාර ව්‍යාපාර කටයුතුවලට අනවශ්‍ය සහ/හෝ ප්‍රයෝජනවත් නොවන ස්වභාවයෙන් හෝ ලක්ෂණ වලින් යුක්තවීම සහ / හෝ එහි ප්‍රතිඵලයක් ලෙස පළමුවන පාර්ශ්වකාර පාර්ශ්වයට යම් පීඩාවක්, අලාභයක් සහ/ හෝ මූල්‍යමය හෝ වෙනත් ආකාරයක අලාභයක් සහ හෝ බැංකුවේ කීර්තියට සහ/ හෝ හොඳනමට හානියක් හෝ අලාභයක් සිදුවන අවස්ථාවකදී දෙවන පාර්ශ්වයේ සේවය පළමුවන පාර්ශ්වය විසින් අවසන් කරනු ලැබිය හැකිය.''(ඇ) අවසන් කිරීම දෙවන ඡේදය ගොනුවේ 16 පිටුව)

"සාමාන්‍ය තත්වයක් යටතේ මෙම ගිවිසුමට අදාළ කාලය තුළ දෙවන පාර්ශ්වය විසින් ලිඛිතව එක් මාසයක(මාස 1) කාලයක් ලබා දෙමින් ඉදිරිපත් කරනු ලබන දැන්වීමක් මගින් මෙම ගිවිසුම් අවසන් කර ගැනීමට හැකියාව ඇති බව දෙපාර්ශ්වය විසින් පිළිගනු ඇත. ඒ ආකාරයට එක් මසක දැනුම් දීමක් සිදු නොවන්නේ නම්, ඉහත සඳහන් එකී මසක දීමනාවට සමාන මුදලක් දෙවන පාර්ශ්වය විසින් පළමුවන පාර්ශ්වය වෙත ගෙවිය යුතුය.''(ඇ) අවසන් කිරීම තුන්වන ඡේදය- ගොනුවේ 16 පිටුව)

"මෙම ගිවිසුමේ ඉහත අංක 02 වන කොටස යටතේ දක්වන ලද පරිදි පළමුවන පාර්ශ්වය විසින් දෙවන පාර්ශ්වය වෙත ගෙවන ලබන දීමනාවට අතිරේකව මහජන බැංකුවේ අනිකුත් සේවකයින් වෙත සාමාන්‍යයෙන් හිමි හෝ එවැනි සේවකයෙකු විසින් භුක්ති විඳිනු ලබන වරප්‍රසාදයක් සඳහා හිමිකමක් හෝ පහසුකමක් හෝ වාසියක් ලබා ගැනීමට තමන්ට අයිතිවාසිකමක් නැති බව, දෙවෙනි පාර්ශ්වය මැනවින් අවබෝධ කරගෙන ඊට එකඟ වී ඒ මත බැඳීමකට පත්ව ඇත. ඒ සම්බන්ධයෙන් ඉල්ලීම් පළමුවන පාර්ශ්වය වෙත පළමුවන පාර්ශ්වය ඉදිරිපත් නොකරනු ලබන බවට ද දෙවන පක්ෂය මෙයින් එකඟ වේ. (9 කොටස දෙවන ඡේදය- ගොනුවේ 18 වන පිටුව)

"දෙවන පාර්ශ්වය විසින් කරනු ලබන මොනයම් හෝ ප්‍රකාශයක් හෝ ඉදිරිපත් කර ඇති සහ/හෝ ඉදිරිපත් කරනු ලබන තොරතුරක් හෝ ලියවිල්ලක් සාවද්‍ය බවට සහ/ හෝ වංචනික බවට සොයාගනු ලැබුවහොත් මොනයම් හෝ පරීක්ෂණයක් නොපවත්වා දෙවන පාර්ශ්වයේ සේවය ඒ අවස්ථාවේදීම අවසන් කරනු ලබයි." (10 කොටස - ගොනුවේ 19 පිටුව)

"මේ සම්බන්ධයෙන් කරුණු දක්වමින් පළමුවන පාර්ශ්වකාර - පැමිණිලිකාර රංගන රත්නායක මහතා විසින් 2023.05.26 දිනැතිව, ප්‍රති පිළිතුරු ලෙස බේරුම්කරු වෙත ඉදිරිපත් කරන ලද දිවුරුම් ප්‍රකාශයේ සඳහන් වන්නේ, ඉහත සඳහන් කළ විනය නියෝගයෙන් පසු තමන් විසින් තම රාජකාරි ඉටුකරමින් සිටියදී 2020 ජූලි 02 දිනට වසර 3 ක කොන්ත්‍රාත් කාලය අවසන් වන බැවින් එදින සිට ක්‍රියාත්මක වන පරිදි, තම සේවය අත්හිටුවන බවත්. (A7) ඒ සම්බන්ධයෙන් පළමුවන පාර්ශ්වකාර පැමිණිලිකරු විසින් 2020.06.17 දිනැතිව මහජන බැංකුවේ සභාපතිවරයා වෙත අභියාචනයක් කර ඇති බවත් (A8) ය.

පළමුවන පාර්ශ්වකාර පැමිණිලිකරු විසින් මහජන බැංකුවේ සභාපතිවරයා වෙත 2020.06.17 දාතමින් යවන ලද අභියාචනයේ සඳහන් කර ඇත්තේ මෙසේය.

"මේ සම්බන්ධයෙන් ඔබතුමන්ට පැහැදිළි කිරීමේදී මා විසින් මීට ඉහතදී සේවය කළ ජාත්‍යන්තර බැංකු කටයුතු අංශයේ ඉහළ සහකාර නිලධාරීන් වන ඩී.ජී.එම්. සෝබා ප්‍රතාපසිංහ මහත්මිය. සී. එම්. ශ්‍රියානි වැලිගම මහත්මිය, ආයතනික පාලන අංශයේ ප්‍රධාන කළමනාකාර මාරියන් මහතා යන අය මේ සම්බන්ධයෙන් නිරන්තරයෙන් දැනුවත් කළ ද, එම ඉහළ නිලධාරීන් විසින් ගනු ලැබූ ඉතා දුර්වල තීරණයක් හමුවේ බණ්ඩාර නමැති මහතාගේ ක්‍රියා කලාපය කිසි විටෙක වෙනස් නොවුණු බව ඉතා කණගාටුවෙන් යුතුව සඳහන් කරනු කැමැත්තෙමි." (A8-53 පිටුව)

"මෙවන් නිලධාරීන්ගේ ක්‍රියාවන් හමුවේ ක්ෂණිකව කෝපයට පත් වූ, මා එම මහතාට පහරදීමට තැත් කළ අතර, පහරදීමක් මා විසින් සිදු නොකළෙමි. එසේම මෙම නිලධාරීන්ගේ නොමනා ක්‍රියා සම්බන්ධයෙන් මා විසින් නිරන්තරයෙන් මේ සම්බන්ධව දැනුවත් කළ ද, කිසිදු ඉහළ නිලධාරි මහතෙකුගෙන් හෝ මහත්මියකගෙන් වාචික වශයෙන් පමණක්ම පිළිතුරු සැපයීම් මගින් මෙම තත්වය දිගින් දිගටම අයහපත් අයුරින්ම ගමන් කළ බවද සඳහන් කරමි" (A8-53 පිටුව)

"තවද, ඔවුන් විශාල කාලයක් සේවය කිරීමත්, මා නව සමාජිකයෙකු වීමත් තුළින් තත්වය ඉතා භයානක අතටත්, ඉතා අවාසි සහගත තත්වයක් මා හට රාජකාරි කිරීමට සිදුව තිබුණි. මෙකී තත්වයක් තුළ මා විසින් වසර 03 ක කාලයක් ඉතා කණගාටුදායක අන්දමින් සේවය සැපයීමට මා හට සිදු වූ බවත්, මීට පෙර මා විසින් රැකියා කිහිපයක් රාජ්‍ය ආයතන වල සිදුකොට ඇති බවත් මෙවන් වූ ක්‍රියා මා විසින් සිදු නොකළ ඇති බව ඉතා සතුටින් යුතුව ප්‍රකාශ කර සිටිමි". (A8)-54 පිටුව)

"එසේම අංක 28 සම්බන්ධයෙන් මා විසින් ඔවුන්ගේ රාජකාරී කටයුතු වලට කිසි විටෙකත් බාධා පැමිණවීමක් සිදුකර නොමැති බවත්, ඔවුන් අපගේ සේවය ඉතා පහත් අන්දමින් ලබාගත් බවද සඳහන් කරනු කැමැත්තෙමි. මීට ඉහත දී ප්‍රධාන කළමනාකාර විමර්ශන හා පරීක්ෂණ වෙතින් යොමුව 83/3/161/9/23 කේ.එම්. හා 2019.04.11 දිනැති ලිපිය මගින් චෝදනා පත්‍රයක් යොමු කොට, මා වරදකරු කිරීමේ අභිලාෂයෙන් කටයුතු කිරීමට කළමනාකාරිත්වය කටයුතු කොට ඇති බව ඉතා කණගාටුවෙන් යුතුව සිහිපත් කර සිටිමි."(A8-54 පිටුව)

ඒ සම්බන්ධයෙන් කරුණු දක්වමින් දෙවන පාර්ශ්වය විසින් 2023.04.17 දාතමින් (10 පිටුව) බේරුම්කරු වෙත පළමුවන ප්‍රකාශය වශයෙන් ඉදිරිපත් කර ඇති සැලකිරීම් වල සඳහන් කර ඇත්තේ රංගන රත්නායක මහතා සේවය කළ රාජකාරි ස්ථානවල ඉහළ නිලධාරීන් විසින් පළමුවන පාර්ශ්වකාර පැමිණිලිකාර රංගන රත්නායක මහතාගේ රාජකාරි කටයුතු සතුටුදායක නොවන බවට විවිධ අවස්ථාවන්හිදී පැමිණිලි කොට තිබූ හෙයින්ද, මෙම අය (රංගන රත්නායක මහතා) සම්බන්ධයෙන් ලබාගන්නා ලද වාර්තාවකට අනුව රංගන රත්නායක මහතා අයහපත් මානසික සෞඛ්‍ය තත්ත්වය සම්බන්ධයෙන් ප්‍රතිකාර ලබාගන්නා බවට තහවුරු වී තිබූ හෙයින්ද, සේවයේ යෙදී සිටියදී වැටුප් රහිත නිවාඩු ලබා ගැනීමට නිරන්තරයෙන් කටයුතු කොට තිබූ හෙයින් ද, රංගන රත්නායක මහතාගේ සේවා වාර්තා සමාලෝචනය කිරීමෙන් අනතුරුව ඔහු යහපත් සේවා වාර්තාවක් පවත්වාගෙන යාමට ආපොහොසත් වී තිබූ හෙයින් ද, ඒ මහතා විනය පියවරයන්ට ලක්ව තිබූ හෙයින් ද, ඔහුගේ සේවය පිළිබඳ ඔහු සේවය කළ රාජකාරි ස්ථානයන්හි නිලධාරීන් විසින් පළමුවන පාර්ශ්වකාර රංගන රත්නායක මහතාගේ සේවය පිළිබඳ සතුටුදායක නොවන බව කළමනාකාරිත්වය වෙත දන්වා තිබූ හෙයින්ද, අවසන් වීමට නියමිතව තිබූ 2020.07.02 දිනෙන් අවසන් වන බැවින් එදින සිට සේවය අවසන් කිරීමට කළමනාකාරිත්වය විසින් තීරණය කර ඇති බවය.

එසේ වුවද පැමිණිලිකරුට එරෙහිව සඳහන් කර ඇති දෝෂාරෝපණයන් සනාථ කරන ලිඛිත හෝ වාචික සාක්ෂි කිසිවක් ඉදිරිපත් කර තිබුණේ නැත.

තවද, බේරුම්කරු ඉදිරියට දෙවන පාර්ශ්වය වෙනුවෙන් කැඳවන ලද සාක්ෂිකාර ප්‍රියන්ත මහතාගේ සාක්ෂි මෙහෙයවමින් දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද (R7 හා R7A) ලේඛණය අනුව සහ 2023.09.12 දාතම දරන ලිඛිත දේශනය අනුව පෙනී යන්නේ 2019.09.02 දින රැස්වූ අභියාචනා කමිටුව විසින් පළමුවන පාර්ශ්වකරුගේ සේවා ගිවිසුම අවලංගු කිරීමටත් පළමුවන පාර්ශ්වකරුගේ හැසිරීම් රටාවන් බැංකු සේවකයෙකුට නොගැලපෙන ක්‍රියාවක් බැවින් ඔහු තවදුරටත් බැංකු සේවයේ රඳවා ගැනීම නුසුදුසු බවටත් තීරණය කර ඇති බවය.

ඉහත සඳහන් කරුණු අනුව 2020.07.02 දින සිට පැමිණිලිකරුගේ සේවය අත්හිටුවමින් පැමිණිලිකරුට දැන්වීමට කිසිදු හේතුවක් උද්ගත වී ඇති බවක් පෙනී යන්නේ නැත. එමෙන්ම ''සේවා ගිවිසුම අවසන්වීම පදනම් කරගෙන සේවකයෙකුගේ සේවය අත්හිටුවීම '' බැංකුවේ විනය සංග්‍රහයේ හෝ බැංකුවේ වෙනත් චක්‍රලේඛයක සඳහන් වන විධිවිධානයක් බව දෙවන පාර්ශ්වය විසින් බේරුම්කරුට අනාවරණය කර නැත. පළමුවන පාර්ශ්වකරුගේ සේවා ගිවිසුමෙහි කාලය ඉකුත්වන විට ඉකුත්වන දිනයේ සිට සේවා ගිවිසුම නැවත දීර්ඝ කිරීමක් නොකරන්නේ නම්, එහි සේවා ගිවිසුම නිරායාසයෙන්ම අවසන් වන අතර අවශ්‍ය වන්නේ ඒ බව දැන්වීම පමණි. එහෙත් පැමිණිලිකරුගේ සේවා ගිවිසුම අනුව ගිවිසුම්ගත කාලය අවසන්වීම හේතු කොටගෙන පළමුවන පාර්ශ්වකරුගේ සේවය අත්හිටුවීමට ක්‍රියා කිරීම සාමාන්‍ය තත්වය ඉක්මවා යන කරුණකි.

කෙසේ වෙතත්, කොන්ත්‍රාත් පදනම මත සේවකයකු බඳවාගත් විට, එම සේවකයා සහ සේව්‍යයා අතර ඇතිවන සියලුම ගණුදෙනු එම ගිවිසුමේ සඳහන් කොන්දේසි හා විධිවිධාන අනුව තීරණය වන බව ප්‍රකට කරුණකි.

ඒ අනුව, සේවා ගිවිසුමේ (ඇමුණුමA3) කොන්දේසි අනුව, දෙවන පාර්ශ්වකරු වෙනුවෙන් නීතිඥ දල්පදාදු මහතා ඉදිරිපත් කර ඇති 2023.4.17 දිනැති සැලකිරීම්වල සඳහන් කර ඇති පරිදි "3(ආ) කොටසෙහි සේවය අවසන්වීම යටතේ " බැංකුවේ මොනයම් හෝ ස්ථිර පත්වීමක් සඳහා කිසිම ඉල්ලීමක් නොකළ යුතුය" යන්න පැහැදිලිව සඳහන්ව ඇති බව බේරුම්කරු පිළිගනී.

එපමණක් නොව,එකී සේවා ගිවිසුම අනුව 2017.07.03 දිනෙන් ආරම්භ වී 2020.07.02 දිනෙන් අවසන් වන සහ අවුරුදු (3)ක නිශ්චිත

3 (කාල පරිච්ඡේදයකට සීමාවන බවද, 3 (ඇ) හි සඳහන්වන විධිවිධාන පරිදි උදාවන යම් සිද්ධිගත කරුණක දී දෙවන පාර්ශවයේ සේවය පළමුවන පාර්ශ්වය විසින් අවසන් කළ හැකි බවද පැහැදිලිව සඳහන් කර ඇත.

එසේ වුවද, සේවා ගිවිසුමේ පළමුවන පාර්ශ්වය විසින් (ඇමුණුමA7) හි සඳහන් කර ඇති පරිදි දෙවන පාර්ශ්වකරු වූ රංගන රත්නායක මහතාගේ සේවය 2020.07.02 දිනෙන් අවසන් වන බැවින්, එදින සිට රංගන රත්නායක මහතාගේ සේවය අත්හිටුවීමට හැකියාවක් ඇති බවක් සේවා ගිවිසුමේ සඳහන් වන්නේ නැත.

මේ සම්බන්ධයෙන් දෙවන පාර්ශ්වය වෙනුවෙන් 2023.09.12 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිඛිත දේශනයෙහි නීතිඥ දල්පදාදු මහතා සඳහන් කර ඇත්තේ 2019.09.02 දිනැති අභියාචනා කමිටුව විසින් කර ඇති නිර්දේශය (ඇමුණුම R7 හා R7 A) අනුව සේවය අවසන් කළ බවය.

නමුත් අභියාචනා කමිටුව රැස්වී ඇති දිනය ලෙස සඳහන් වන්නේ 2019.09.02 දින (ඇමුණුමR7) වන අතර, සේවය අත්හිටුවීම දන්වමින් පළමුවන පාර්ශ්වකාර චූදිත නිලධාරියාට යවා ඇති ලිපියේ (ඇමුණුම A7) දිනය ලෙස සඳහන් වන්නේ 2020.06.01 දින වේ. එමෙන්ම පළමුවන පාර්ශ්වය සේවය අත්හිටුවීම සම්බන්ධයෙන් අභියාචනය කර ඇත්තේ 2020.06.17 දින වේ. එයින් පැහැදිලි වන්නේ පළමුවන පාර්ශ්වකරුවන්ගේ සේවය අත්හිටුවීම හා එම අත්හිටුවම සම්බන්ධයෙන් පළමුවන වන පාර්ශ්වය අභියාචනයක් කිරීමටත් පෙර සේවය අත්හිටුවීම සිදුකර ඇති බවත් එම සේවය අත්හිටුවීම සම්බන්ධයෙන් පළමුවන පාර්ශ්වය ඉදිරිපත් කර නොමැති අභියාචනයක් සම්බන්ධයෙන් අභියාචනා කමිටුව 2019.09.02 දින රැස්වී විභාගයට භාජනය කර ඇති බවත්ය.

මෙම කරුණ දින සටහන් කිරීමේ දී ඇතිවූ වරදක් ලෙස සරළව සිතිය නොහැකි අතර, එම පළමුවන පාර්ශ්වකරුට අගතියක් කිරීමේ චේතනාවෙන් යුතුව පැවැත්වූ අභියාචනා කමිටු රැස්වීමක් බව බේරුම්කරුගේ පිළිගැනීම වේ.

එවැනි තත්ත්වයක් යටතේ පළමුවන පාර්ශ්වකරු වෙත ඉහත සඳහන් කළ පරිදි සේවය අත්හිටුවමින් ලිපියක් එවීමට හේතුවූ විශේෂ කරුණක් තිබූ බවට බේරුම්කරුට අනාවරණය වන්නේ නැත.

තවද ගිවිසුම අවසන් වීම හේතු කොටගෙන සේවකයකුගේ සේවය අවසන් වන අවස්ථාවක සේවකයාට දන්වමින් යවනු ලබන ලිපිය පත්වීම් බලධරයා විසින්ම සිදුකළ යුතු කාර්යයක් ලෙස බේරුම්කරු විශ්වාස කරයි. එනම් මහජන බැංකු පනතේ විධිවිධාන අනුව සේවකයන් බඳවා ගැනීම සේවයෙන් ඉවත් කිරීම සිදුකළ යුත්තේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් හෝ අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අනුමැතිය අනුව බව පනතේ විධිවිධාන අනුව පැහැදිළි වේ.

එහෙත් පළමුවන පාර්ශ්වකාර පැමිණිලිකරුගේ සේවා ගිවිසුම අවසන්වීම හේතු කොටගෙන සේවය අත්හිටුවීමේ ලිපිය යවා ඇත්තේ ප්‍රධාන මානව සම්පත් කළමනාකරු විසිනි. ඔහු එම ලිපිය අත්සන් කරන්නේ අධ්‍යක්‍ෂ මණ්ඩලයේ නියමය පරිදි බව හෝ තමාට පැවරී ඇති බලයක් අනුව හෝ බව එහි සඳහන් කර නැත. මහජන බැංකුවේ විනය රීති මාලාවේ 34.1 වන වගන්තිය ඒ අනුව ප්‍රධාන මානව සම්පත් කළමනාකරුට විනය නියෝගයක් නිවේදනය කිරීමේ බලය ඇතත් සේවා ගිවිසුම අවසන්වීම හේතු කොටගෙන සේවය අත්හිටුවීමේ ලිපියක් යැවීමට බලය ඇත්ද යන්න සනාථ කර නැත. ප්‍රධාන මානව සම්පත් කළමනාකරු විසින් එවැනි ලිපියක් අත්සන් කර යැවීම ප්‍රධාන මානව සම්පත් කළමනාකරු තම බලය ඉක්මවා ක්‍රියා කිරීමකි. එහෙයින් එම ලිපිය මගින් දන්වා ඇති පරිදි පැමිණිලිකරුගේ සේවය අවසන් වන්නේ හෝ අත්හිටුවෙන්නේ නැත.

ඒ හැරත් පළමුවන පාර්ශ්වකාර පැමිණිලිකරු තම දිවුරුම් ප්‍රකාශයේ සඳහන් කර ඇති පරිදි තමන්ට එරෙහිව නිකුත් කරන ලද චෝදනා පත්‍රය සම්බන්ධයෙන් තමන් ඉදිරිපත් කරන ලද කරුණු පිළිබඳ සේවක කමිටුව දෙන ලද තීරණයක් පිළිගෙන ඔහු කිසිදු අභියෝගයක් නොකර රාජකාරි කරමින් සිටින අවස්ථාවක තමන් හා කොන්ත්‍රාත් පදනම මත සේවයට බඳවාගත් සෙසු සියලුම දෙනා සේවගේ ස්ථිර කරන ගමන්ම පැමිණිලිකරු පිළිබඳ අලුතින් කිසිදු විශේෂ විනය විරෝධී හෝ විෂමාචාර ක්‍රියාවක නියැළී නොසිටියදී සේවය ස්ථිර කිරීම වෙනුවට සේවා ගිවිසුම අහෝසි වීම මත සේවය අත්හිටුවීම කිසිසේත්ම සාධාරණීකරණය කළ හැකි කරුණක් නොවේ.

ඉහත සඳහන් කරුණු අනුව පළමුවන පාර්ශ්වකාර පැමිණිලිකරු 2020.07.02 දින සිට සේවය අත්හිටුවමින් පැමිණිලිකරුට දැන්වීමට කිසිදු හේතුවක් උද්ගත වී ඇති බවක් පෙනී නොයන හෙයින්ද, එමෙන්ම සේවා ගිවිසුම අවසන්වීම පදනම් කරගෙන සේවකයෙකුගේ සේවය අත්හිටුවීම, විනය සංග්‍රහයේ හෝ බැංකුවේ වෙනත් චක්‍රලේඛයක සඳහන් වන විධිවිධානයක් බව දෙවන පාර්ශ්වකරු බේරුම්කරුට අනාවරණය කර නොමැති හෙයින්ද, බඳවා ගනු ලැබූ සේවකයන් අතරින් පළමුවන පාර්ශ්වකාර එම්. ඒ. ආර්. රංගන රත්නායක මහතාගේ පමණක් කොන්ත්‍රාත් ගිවිසුම අවසානයේ දී සේවය අත්හිටුවීම යුක්ති සහගත නොවන අතරම එය අත්තනෝමතික හිතුවක්කාරී තීරණයක් බවද තීරණය කරමි.

3.3. බඳවා ගනු ලැබූ සේවකයන් අතරින් පළමුවන පාර්ශ්වකාර එම්. ඒ. ආර්. රංගන රත්නායක මහතා පමණක් කොන්ත්‍රාත් ගිවිසුම අවසානයේ දී මහජන බැංකුවේ ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය නොකිරීම යුක්ති සහගතද?.

පළමුවන පාර්ශ්වය වූ පැමිණිලිකාර රංගන රත්නායක මහතා පමණක් සේවයේ ස්ථිර නොකොට, ඔහු සමග එකට කොන්ත්‍රාත් පදනම මත සේවයට බැඳුණු සෙසු කණ්ඩායම ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය කිරීම සඳහා දෙවන පාර්ශ්වය විසින් ගන්නා ලද තීරණය සාධාරණිකරණය කිරීම සඳහා ඉදිරිපත් කර ඇති කරුණු සැළකිල්ලට ගැනීමේදී එකී කරුණු සහ ඒ පිළිබඳව බේරුම්කරුගේ නිරීක්ෂණ පහත සඳහන් පරිදි පෙළගැස්විය හැකිය.

(**a**). **R. 7** වශයෙන් දෙවන පාර්ශ්වය විනිශ්චය සභාව ඉදිරියේ සළකුණු කරන ලද ලේඛනයෙහි සඳහන් කර ඇත්තේ 2019.09.02 දින රැස්වූ අභියාචනා කමිටුව විසින් රංගන රත්නායක මහතා විසින් සිදුකරන ලදැයි චෝදනා කරන ලද සිද්ධියද, ඒ පිළිබඳව පැවැත්වූවා යැයි කියනු ලැබූ මූලික විමර්ශන වාර්තාවද, මූලික විමර්ශනයේදී සාක්ෂි දෙනු ලැබූ සාක්ෂිකරුවන් දෙදෙනෙකුගේ ප්‍රකාශද, ඉදිරිපත් කරන ලද චෝදනා පත්‍රයට පදනම් වූ විෂමාචාර ක්‍රියාවන්ද, මූලික විමර්ශන නිලධාරියාගේ නිරීක්ෂණයෙන්ද, 2019.02.21 දිනැති සහකාර සාමාන්‍යාධිකාරී කමිටු වාර්තාවද, 2019.05.07 දිනැති සහකාර සාමාන්‍යාධිකාරී කමිටු වාර්තාවද, එහි නිර්දේශ ද, සැලකිල්ලට ගන්නා විට, පළමුවන පාර්ශ්වය වූ පැමිණිලිකාර රංගන රත්නායක මහතාගේ හැසිරීමේ රටාව බැංකු සේවකයකුට නොගැලපෙන ක්‍රියාවක් බැවින්, ඔහු තවදුරටත් බැංකු සේවයේ රඳවා ගැනීම නුසුදුසු බවය.

එහෙත් ඉහත සඳහන් කර ඇති පරිදි අභියාචනා කමිටුව රැස්වී ඇත්තේ (2019.09.02) රංගන මහතා සේවය අත්හිටුවීමේ ලිපිය යවන ලද දිනයට (2020.06.01) හා රංගන රත්නායක මහතා විසින් සභාපතිතුමා වෙත අභියාචනය යවා ඇති දිනයට (2020.06.17) පෙර දිනයක වන හෙයින්, එම කමිටු වාර්තාවේ නිර්දේශය රංගන රත්නායක මහතා ස්ථිර සේවයට අන්තර්ග්‍රහනය කිරීමට අදාළ වන්නේ නැත.

(**b**). අතිරේක ප්‍රධාන නීති නිලධාරිනි විසින් විමර්ශන හා පරීක්ෂණ අංශයේ සහකාර සාමාන්‍යාධිකාරී වෙත යවන ලද 2019.10.04 දාතම දරන අභ්‍යන්තර මොමෝ පත්‍රය (**R8**) මගින් දන්වා ඇත්තේ ''**එම්. කේ. ඒ. රංගන මහතා කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදී සිටිය දී නියෝජ්‍ය කළමනාකාර මහතෙකුට ගෙල සිරකර ප්‍රින්ටර් යන්ත්‍රය ඔසවා පහරදීමට තැත් කර ඇති බව පෙනී යන අතර මෙම කරුණ එකී එම්. කේ. ඒ. රංගන මහතා විසින් ඔහුගේ ප්‍රකාශයෙන් පිළිගෙන තිබේ. මෙවැනි තත්ත්වයක් යටතේ කොන්ත්‍රාත් පදනම මත සිටින සේවකයකු වන රංගන මහතාට වහාම ස්වයෙන් අවසන් නොකොට තවදුරටත් පරීක්ෂණ පවත්වමින් බැංකුව තුළ තබා ගැනීම පිළිගත නොහැකි බවය**''.

එසේ වුවද විනය ක්‍රියාවලියකදී චූදිත නිලධාරියෙකුගෙන් ලබා ගන්නා ප්‍රකාශයක අන්තර්ගත කරුණු චූදිත නිලධාරියාට එරෙහිව පවත්වනු ලබන විධිමත් පරීක්ෂණයකදී චූදිත නිලධාරියා විසින් සාක්ෂි දෙමින් පිළිගනු ලැබුව හොත් මිස අන් කවර අවස්ථාවක පිළිගත්තේ නමුත් එය පිළිගැනීමක් ලෙස සැලකීම නිලධාරියෙකුට කරනු ලබන අගතියක් බව පෙන්වා දිය හැකිය. නමුත් ප්‍රස්තුත සිද්ධියේදී පළමුවන පාර්ශ්වකාර පැමිණිලිකාර චූදිත නිලධාරී එම්. කේ. ඒ. රංගන මහතා සම්බන්ධයෙන් එවැනි විධිමත් පරීක්ෂණයක් පැවැත් වූ බවක් බේරුම්කරණ සැසිවලදී දෙවන පාර්ශ්වය සනාථ කළේ නැත.

ඒ හැරත් '' තැත් කිරීම'' පිළිබඳ වරද මහජන බැංකුවේ විනය රීති මාලාවේ සුළු විෂමාචාර ක්‍රියා පිළිබඳ I වන උපලේඛනයේ සඳහන් සුළු විෂමාචාර ක්‍රියාවක් ලෙස හෝ බරපතල වැරදි පිළිබඳ II වන උපලේඛනයේ සඳහන් බරපතල වරදක් ලෙස හෝ සඳහන් වන්නේ නැත.

(**c**). දෙවන පාර්ශ්වය විසින් 2023.04.17 දාතමින් බේරුම්කරු වෙත ඉදිරිපත් කර ඇති සැලකිරීම්වල (අංක 12) ''උක්ත අවස්ථාව රංගන මහතාට අහිමි වූයේ ඔහු යහපත් සේවා වාර්තාවක් පවත්වාගෙන යාමට අපොහොසත් වී තිබීමත් ඒ මහතා විනය පියවරයන්ට ලක්ව තිබූ අතර, ඔහුගේ සේවය පිළිබඳ ඔහු සේවය කළ රාජකාරී ස්ථානයන්හි නිලධාරීන් විසින් රංගන රත්නායක මහතාගේ සේවය පිළිබඳ සතුටුදායක නොමැති බව අප වෙත දන්වා සිටීම හා රංගන රත්නායක මහතා මෙකී කොන්ත්‍රාත් කාලය තුළදී වැටුප් රහිත නිවාඩු ලබාගැනීමට කටයුතු කර තිබීමත් යන කරුණු හේතුවෙන් බවත්, කෙසේ වුවද, බැංකුවේ විනය ක්‍රියාවලිය අනුව කටයුතු කිරීමෙන් පසු වරදකරුවෙකු වී තරයේ අවවාද කළ අයෙකුට තවදුරටත් බැංකුවේ ස්ථිර සේවය ලබාදීම සම්බන්ධයෙන් කටයුතු කිරීම තුළින් ඉදිරියේ දී අප බැංකුව පරිපාලනමය හා සේවකයන් අතර වෘත්තීය ගැටලු නිර්මාණය වීමට ඉඩ ඇති බව කාරුණිකව දන්වා සිටිමු.'' යනුවෙන් සඳහන් කර ඇත.

ඒ හැරත් පළමුවන පාර්ශ්වකාර පැමිණිලිකරු තම දිවුරුම් ප්‍රකාශයේ සඳහන් කර ඇති පරිදි තමන්ට එරෙහිව නිකුත් කරන ලද චෝදනා පත්‍රය සම්බන්ධයෙන් තමන් ඉදිරිපත් කරන ලද කරුණු පිළිබඳ සේවක කමිටුව දෙන ලද තීරණයක් පිළි ගෙන ඔහු කිසිදු අභියෝගයක් නොකොට රාජකාරී කරමින් සිටින අවස්ථාවක තමන් හා කොන්ත්‍රාත් පදනම මත සේවයට බඳවාගත් සෙසු සියලුම දෙනා සේවයේ ස්ථිර කරන ගමන්ම පැමිණිලිකරු පිළිබඳ අලුතින් කිසිදු විශේෂ විනය විරෝධී හෝ විෂමාචාර ක්‍රියාවක නොනියැලි සේවයේ යෙදී සිටියදී සේවය ස්ථිර කිරීම වෙනුවට සේවා ගිවිසුම අහෝසි වීම මත සේවය අත්හිටුවීම කිසිසේත්ම සාධාරණීකරණය කළ හැකි කරුණක් නොවේ.

**(d)**. ලේඛනගත කිරීමේ ඒකකයේ කළමනාකාරිණී විසින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත්) වෙත යවා ඇති 2020.03.16 දිනැති අභ්‍යන්තර මෙමෝ පත්‍රය ( R 9 - අංක 199 පිටුව) මගින් දක්වා ඇත්තේ ''අදළ සේවක මහතාගේ හැසිරීම් රටාව නිසා රාජකාරි නිසි ලෙස සිදුකිරීම සඳහා නිරන්තර අධීක්ෂණයක් යටතේ කටයුතු කිරීමට සිදුව ඇති බවත්. ඒ පිළිබඳ සොයා බැලීමේදී මින් පෙර සේවය කළ ස්ථානයන්හි දී ගැටලුකාරී තත්වයක් ඇතිකර තිබූ බව දැනගැනීමට හැකි වූ බවත්, ඒ පිළිබඳව සේවක මහතා විසින්ම පිළිගෙන ඇති බවත්, එබැවින් මෙම සේවක මහතා මෙවන් පරිසරයක රාජකාරි කටයුතු කිරීමට යෝග්‍ය නොවන බව හැඟෙන බැවින් සුදුසු කටයුතු සඳහා ඔබතුමාට කාරුණිකව දැනුවත් කරන බවත් ය.

ඉහත සඳහන් කරන ලද මෙමෝ පත්‍රයේ දක්වෙන ආකාරයට 'පළමුවන පාර්ශ්වකාර පැමිණිලිකාර ''චූදිත නිලධාරී එම්. කේ. ඒ. රංගන මහතා මින් පෙර සේවය කළ ස්ථානයන්හි දී ද ගැටලුකාරී තත්වයක් ඇතිකර තිබූ කරගෙන තිබූ බවට'' කරනු ලබන ප්‍රකාශයත්, ''ඒ පිළිබඳව සේවක මහතා විසින්ම පිළිගෙන ඇත'' යනුවෙන් සඳහන් කර ඇති ප්‍රකාශයත් සනාථ කිරීම සඳහා අනුව චූදිත නිලධාරී එම්. කේ. ඒ. රංගන මහතා කිනම් ස්ථානවලදී කිනම් ගැටලුකාරී තත්වයක් ඇති කර ගෙන තිබුණේද යන්න සහ ඇතිකර ගෙන තිබූ බවට දැනගැනීමට ලැබුණු ගැටලුකාරී තත්වයක් මොනවාද යන්න සඳහන් කර නැත.

**(e)**. **R. 11** වශයෙන් සඳහන් කරන ලද **Board Human Resource and Remuneration Committee** වෙත රංගන රත්නායක මහතාගේ සේවා කාලය දීර්ඝ නොකිරීම පිණිස ඉදිරිපත් කරන ලද මාණ්ඩලික පත්‍රිකාවේ සඳහන් කරුණු සැලකිල්ලට ගෙන එම කමිටුව විසින් තීරණය කර ඇත්තේ ද, පළමුවන පාර්ශ්වකාර රංගන රත්නායක මහතාගේ අසතුටුදායක හැසිරීම නිසා සේවා කාලය දීර්ඝ කළ නොහැකි බවය. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත්) වෙත ලැබුණු (**අංක 202 පිටුව**).

Human Resource and Remuneration කමිටුව විසින් තම නිර්දේශය සඳහා පදනම් කර ගෙන ඇති කරුණු සියල්ලම ඉහත සඳහන් කර ඇති කරුණුම වන අතර, අමතරව ඉදිරිපත් කර ඇත්තේ **හාම්පුතුන්ගේ සංගමයෙන් නීතිමය මතයක් ලබාගත් බවට කර ඇති සටහන** පමණි. මහජන බැංකුවට නීතිමය මතයක් ලබා ගැනීමට අවශ්‍යතාවක් තිබුණේ නම් එය ලබාගත යුතුව තිබුණේ හාම්පුතුන්ගේ සංගමයෙන් නොව නීතිපති දෙපාර්තමේන්තුවෙන් බව බේරුම්කරු විශ්වාස කරයි.

ඉහත සඳහන් කර ඇති පරිදි රංගන රත්නායක මහතා හැර සෙසු අන්තර්ග්‍රහණය කරන ලද සංඛ්‍යාව කොපමනද යන්න හෝ ඔවුන්ගේ නම් මොනවාද යන්න හෝ ඔවුන්ගේ තුන් වසරක සේවා කාලය ඇගයීමට ලක්කරන ලද වාර්තා හෝ කිසිවක් බේරුම්කරු වෙත ඉදිරිපත් නොකරන ලද අතර, ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය කරන ලද කොන්ත්‍රාත් පදනම මත සේවය කළ නිලධාරීන් එසේ අන්තර්ග්‍රහණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය තීරණයක් ගෙන තිබූ බව සඳහන් වුවත්, එකී අධ්‍යක්ෂ මණ්ඩල තීරණය බේරුම්කරු වෙත ඉදිරිපත් වූයේ නැත.

එමෙන්ම රංගන රත්නයක මහතාට මහජන බැංකුවේ ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය කිරීමේ අවස්ථාව අහිමිවූයේ ඔහුගේ සේවා වාර්තා යහපත් නොවූ නිසා බව ප්‍රකාශ කර ඇතත්, ප්‍රශ්නගත සිද්ධිය හැරුණු විට රංගන රත්නායක මහතා සම්බන්ධයෙන් වාර්තාගත වූ වෙනත් කිසිදු අහඹු ලෙස සිදු වූ වරදක් පිළිබඳව හෝ ඔහු සම්බන්ධයෙන් සෙසු සේවකයන් අප්‍රසාදය පළකරන බවට සඳහන් කර ඇති පෙත්සමක් හෝ ලිපියක් හෝ ඔහු වැටුප් රහිත නිවාඩු ලබාගෙන ඇති බව සනාථ කරන ලේඛනයක් හෝ බේරුම්කරු වෙත දෙවන පාර්ශ්වය ඉදිරිපත් කළේ නැත. එසේම රංගන රත්නායක මහතා බැංකුවේ ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය කිරීම නිසා වෘත්තීය ගැටලු නිර්මාණය වීමට ඉඩ ඇති බවට වන ප්‍රකාශය සාක්ෂි සහිතව සනාථ කර නැත.

මෙම සියලුම නිර්දේශයන් විනය රීති සංග්‍රහයේ දක්නට නොලැබෙන ආකාරයේ සහ ප්‍රශ්නගත සිද්ධියට අදළ නොවන, නිර්දේශයන් බවද, ඒ ආකාරයෙන් විවිධ අංශ වලින් ලබාගෙන ඇති මෙම නිර්දේශයන්ගේ පරමාර්ථය වන්නේ පළමු පාර්ශ්වකරු හැර ඔහු සමග කොන්ත්‍රාත් පදනම මත සේවයට බඳවා ගන්නා ලද අනෙකුත් අයගේ පත්වීම් සාධාරණීකරණය කිරීම සඳහා කරන ලද උත්සාහයක් බව බේරුම්කරුගේ අදහස වේ.

තවද මෙලෙස කොන්ත්‍රාත් පදනම මත නිශ්චිත කාලසීමාක් සඳහා සේවය ලබාගෙන සිටි කාර්යාල සහායකයින්ගේ යහපත් සේවා වාර්තා සහිත මෙන්ම බැංකුවේ ව්‍යාපාරික කටයුතු වෙනුවෙන් සුදුසු සේවකයන් බැංකුවේ ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය කිරීමට මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර තිබූ බවත්, ඒ අනුව එකී අවශ්‍යතාවයන් සපුරාලන ලද යහපත් සේවා වාර්තා සහිත සේවකයින් බැංකුව වෙත ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය කිරීමට කටයුතු කොට තිබූ බවත් සඳහන් කර ඇත.

තවද ගිවිසුම අවසන් වීම හේතු කොටගෙන සේවකයකුගේ සේවය අවසන් වන අවස්ථාවක සේවකයාට දන්වමින් යවනු ලබන ලිපිය පත්වීම් බලධරයා විසින්ම සිදුකළ යුතු කාර්යයක් ලෙස බේරුම්කරු විශ්වාස කරයි. එනම් මහජන බැංකු පනතේ විධිවිධාන අනුව සේවකයන් බඳවා ගැනීම සේවයෙන් ඉවත්කිරීම සිදුකළ යුත්තේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හෝ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය අනුව බව පනතේ විධිවිධාන අනුව පැහැදිලි වන බැවිණි.

එමෙන්ම පළමුවන පාර්ශ්වකරුගෙන් හරස් ප්‍රශ්න විමසීමේදී දෙවන පාර්ශ්වය විසින් තහවුරු කර ඇති කාරණය වන්නේ, එසේ සේවය ස්ථිර කරන ලද සෙසු සේවකයන් (62 හෝ 82) ට පළමුවන පාර්ශ්වය මෙන් විනය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණු නිසා සේවය ස්ථිර කළ බවය. (ගොණුවේ 68 පිටුව)

පළමු වන පාර්ශ්වකාර රංගන රත්නායක මහතා විසින් බේරුම්කරු ඉදිරියේ දෙවන පාර්ශ්වකරුගේ නීතිඥ මහතාගේ ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් සඳහන් කළේ දෙවන පාර්ශ්වකරු විසින් තමා හැර මහජන බැංකුවේ ස්ථිර සේවයට අන්තර්ගත කරන ලද සියලුම දෙනාම පළමුවන පාර්ශ්වකරු මෙන්ම එකී කාලසීමාව සඳහා බඳවාගත් අය බවත්, ඔවුන්ගේ කොන්ත්‍රාත් කාලය ද අවසන් වීමෙන් පසු ඔවුන් වසරක කාලයකට පෙර දතම් කරමින් ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය කළ බවත් ය. එම ප්‍රකාශයක් දෙවන පාර්ශවය විසින් සාක්ෂි මගින් හෝ ලිඛිත දේශනය මගින් ප්‍රතික්ෂේප කර නැත.

එසේම කොන්ත්‍රාත් පදනම මත සේවයට බඳවාගත් අයගේ සේවා කාලය අවසන්වීමෙන් පසු වසරක කාලයකට පෙරදාතම් කරමින් ස්ථිර සේවයට අන්තර්ගග්‍රහණය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කළ බවක් හෝ එවැනි නිරීක්ෂණ සටහනක් හෝ බේරුම්කරු වෙත ඉදිරිපත් කර නැත.

මහජන බැංකුවට සේවකයන් බඳවා ගැනීමේ ප්‍රතිපත්තිය හෝ මහජන බැංකුවට සේවකයන් බඳවා ගැනීමේ පටිපාටිය, බේරුම්කරු වෙත ඉදිරිපත් නොවූවත්, කොන්ත්‍රාත් පදනම මත සේවයට බඳවාගත් සේවකයන් වසරක කාලයකට පෙරදතම් කර, ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය කිරීම කිසිසේත්ම සාධාරණීකරණය කළ හැකි කරුණක් නොවේ.

එමෙන්ම පළමුවන පාර්ශ්වකරු විසින් සිදුකළා යැයි කියනු ලබන විෂමාචාර ක්‍රියාව සම්බන්ධයෙන් විනය රීති මාලාව අනුව විනයානුකූල ක්‍රියාමාර්ගයක් ගෙන ඔහුට විනයානුකූල දඬුවමක් ලබා දී තිබියදී, තවදුරටත් ඒ පිළිබඳ සැලකිලිමත් වෙමින්, ඔහු සමග කොන්ත්‍රාත් පදනම මත සේවයට ගත් සෙසු අයගෙන් වෙන්කොට ඔහුට ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය කිරීම ප්‍රතික්ෂේප කිරීම ඔහුට කරන ලද වෙනස්කමක් ලෙස ද, ඒ මගින් ඔහුට අගතියක් සිදුවී ඇති බවද, එම තීරණය අත්තනෝමතික අසාධාරණ තීරණයක් බවද බේරුම්කරු පිළිගනී.

**මේ සම්බන්ධයෙන් පළමුවන පාර්ශ්වකරුගේ නීතිඥ මහතා විසින් 2023.09.12 දිනැතිව ඉදිරිපත් කර ඇති තම ලිඛිත දේශනයේ සඳහන් කර ඇති ඉන්දියානු ශ්‍රේෂ්ඨාධිකරණයේ ( Lt. Governor Delhi and others Vs. Hc Narindder Singh (2004) 13 SCC 342) නඩු තීන්දුවකින්** උපුටා ගෙන ඇති කොටසේ දක්වෙන නිගමනයට බේරුම්කරුද ගරුකරන බව සඳහන් කරනු කැමැත්තෙමි.

කෙසේ වෙතත් දෙවන පාර්ශ්වය විසින් රංගන රත්නායක මහතා මහජන බැංකුවේ ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය නොකිරීම සම්බන්ධයෙන් දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කර ඇති කරුණු කිසිවක් විධිමත්ව සනාථ කර නොමැති හෙයින් ඒ සියලුම කරුණු රංගන රත්නායක මහතා ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය නොකිරීමට තරම් යුක්ති සහගත සහ සාධාරණ කරුණු ලෙස පිළිගැනීමට බේරුම්කරු ප්‍රතික්ෂේප කරයි.

තවද කොන්ත්‍රාත් පදනම මත සේවයට ගන්නා ලද නිලධාරීන් ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කළේ නම්, කොන්ත්‍රාත් පදනම මත සේවයට ගන්නා අය සහ බැංකුව අතර, අත්සන් කරන ලද සේවා ගිවිසුම කඩ කරමින්, කොන්ත්‍රාත් පදනම යටතේ සේවය කළ නිලධාරීන් වසරක කාලයකට පෙරදතම කරමින් ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගන්නා ලද තීරණය මගින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වැරදි පූර්වාදර්ශයක් නිර්මාණය කර ඇති බවද පෙන්වා දෙමි.

**3.4. පළමුවන පාර්ශවකරු මහජන බැංකුවේ ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය නොකිරීම නිසා ඔහුට අසාධාරණයක් වී ඇත්ද ?**

පළමුවන පාර්ශවකරු තම දිවුරුම් ප්‍රකාශයේ සඳහන් කර ඇති පරිදි එකම වරදකට දෙවරක් දඬුවම් කිරීම මගින් (11 ඡේදය) හා තමා හැර තමා සමග කොන්ත්‍රාත් පදනම මත සේවයට බඳවාගත් සේවකයන් වසරක කාලයකට පෙරදතම් කර, ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය කිරීම මගින් තමාට අසාධාරණයක් සිදුවී ඇති බව සඳහන් කර ඇත. ඒ බව ඉහත සඳහන් කරන ලද විශ්ලේෂණ කරුණු අනුව බේරුම්කරු ද පිළිගනී.

**3.5. පළමුවන පාර්ශවකරු මහජන බැංකුවේ ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය නොකිරීම නිසා ඔහුට සිදු වී ඇති අසාධාරණය සම්බන්ධයෙන් සැලසිය යුතු සහන**

පළමුවන පාර්ශ්වකරු විසින් තම දිවුරුම් ප්‍රකාශයේ සඳහන් කර ඇති එකම සහනය වන්නේ, තමා සමග කොන්ත්‍රාත් පදනම මත සේවයට බඳවාගෙන ඇති සියලුදෙනා ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය කර ඇති ආකාරයෙන් තමා ද එකී සේවයට අන්තර්ග්‍රහණය කරන ලෙසය. බේරුම්කරුගේ නිගමනය වන්නේ ද පළමුවන පාර්ශ්වකරු ඉහත සඳහන් කළ පරිදි සෙසු කොන්ත්‍රාත්කාර පත්වීම් දෙන ලද ආකාරයටම ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය කිරීමට යුක්ති සහගත කරුණක් වන බවය.

එහෙයින්

(1) මෙම ප්‍රදානය *ගැසට් පත්‍රයේ* පළකිරීමෙන් පසු මසක් ඇතුළත පළමුවන පාර්ශ්වකාර පැමිණිලිකරු ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය කර අනෙකුත් සේවකයන් සේවයේ ස්ථිර කරන ලද 2020.10.05 දින සිට ක්‍රියාත්මක වන පරිදි සේවයේ ස්ථිරකර දකුණු කොළඹ සහකාර කම්කරු කොමසාරිස් වෙත දැන්වීමටත්,

(2) පළමුවන පාර්ශ්වකාර පැමිණිලිකරු සේවයේ නොයෙදී සිටි කාලය තුළ එනම්, 2020.10.05 දින සිට ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය කරනු ලබන දිනය දක්වා කාලය තුළ ඔහු ට අදළ තනතුරේ සේවයේ යෙදී සිටියා සේ සළකා ගණනය කරනු ලබන හිඟ වැටුප ගෙවීමටත් එම හිඟ වැටුප ගෙවන බව තහවුරු කරුනු වස් (රු. 120,000/ x 37) රු. 4,440,000ක මුදලක් දකුණු කොළඹ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කිරීමටත් දෙවන පාර්ශ්වයට නියම කරමි.

(3) හිඟ වැටුප, මෙම ප්‍රදානය *ගැසට් පත්‍රයේ* පළකිරීමෙන් පසු මසක් ඇතුළත දකුණු කොළඹ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කළ යුතු බව දෙවන පාර්ශ්වයට නියම කරමි.

මෙම ප්‍රදානය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව තීරණය කරමි.

ආචාර්ය. ඒ. එච්. ගමගේ,
බේරුම්කරු.

2024 මැයි මස 07 වැනි දින,

EOG 07 - 0043

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.